හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை

Office for Reparations - Sri Lanka

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

2025

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව 2025

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

අංක 40, බුත්ගමුව පාර,

රාජගිරිය.

පටුන

1. **සභාපතිතුමියගේ පණිවිඩය** 4

2. **අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය** 6

3. **ආයතනික පැතිකඩ පිළිබඳ දළ විශ්ලේෂණය** 8

   I. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 8
   II. පනත යටතේ පැවරී ඇති බලතල 10
   III. දැක්ම සහ මෙහෙවර 11
   IV. සංවිධාන ව්‍යුහය 12
   V. පාලන ව්‍යුහය 12

4. **මෙහෙයුම් පරිසරය** 14

   i. ක්ෂේත්‍ර ප්‍රවණතා සහ වර්ධනයන් 14
   ii. ප්‍රධාන පාර්ශවකරුවන් 15
   iii. ආර්ථික හා දේශපාලන පරිසරය 15

5. **කාර්යසාධන දළ විශ්ලේෂණය** 16

   I. හානිපූරණ වැඩසටහන 16

      i. මූල්‍යමය වන්දි ප්‍රදානය 16
      ii. ජීවනෝපාය සහාය වැඩසටහන 20
      iii. මනෝසමාජීය සහාය වැඩසටහන 22
      iv. ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් වෙත වාර්තා ඉදිරිපත් කිරීම 22
      v. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 22

6. **සේවා සැපයීමේ ප්‍රතිඵල - මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම** 28

7. **මූල්‍ය කාර්යසාධනය** 30

   I. ආදායම් සහ වියදම් සාරාංශය 30
   II. ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ප්‍රවණතා 31
   III. ආර්ථික අගය එකතු කිරීමේ ප්‍රකාශය 33
   IV. දස අවුරුදු සාරාංශය 34

8. **මානවසම්පත් සහ ආයතනික ධාරිතාව** 35

   I. කාර්ය මණ්ඩල පැතිකඩ 35
   II. බඳවා ගැනීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම් 37
   III. ධාරිතා සංවර්ධනය 38
   IV. කාර්ය මණ්ඩල විවිධත්ව මිනුම් 39

9. **පාලනය සහ අවදානම් කළමනාකරණය** 40

10. **ප්‍රධාන අභියෝග සහ උගත් පාඩම්** 41

    - මෙහෙයුම් සහ උපායමාර්ගික අභියෝග 41

11. **ඉදිරි වර්ෂ සඳහා වන සැලැස්ම** 43

12. **ඇමුණුම් - විගණකාධිපති වාර්තාව** 45

1. සභාපතිතුමියගේ පණිවිඩය

සමාලෝචනයට භාජනය වන මෙම වර්ෂය, ගැටුම්, සිවිල් නොසන්සුන්තා සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් වලට ගොදුරු වූවන් වෙත සහන සැලසීමේ අපගේ ව්‍යවස්ථාපිත කාර්යභාරය අඛණ්ඩව ඉටුකිරීමෙහි ලා, හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) ඒකාබද්ධ කිරීම්, සම්පූර්ණ කිරීම් මෙන් ම ස්ථාවර ප්‍රගතියක් අත්කරගත් කාල පරිච්ඡේදයක් සනිටුහන් කරයි.

2025 වර්ෂය තුළ දී, මෙම කාර්යාලය මූල්‍යමය වන්දි ගෙවීම් වලින් ඔබ්බට යමින්, ජීවනෝපාය සංවර්ධනය සහ මනෝ-සමාජීය සහාය ලබා දීම මඟින් සාමූහික හානිපූරණය සඳහා වන තම ප්‍රවේශය අඛණ්ඩව ශක්තිමත් කරන ලදි. 2024–2025 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද සහ අධීක්ෂණය කරන ලද ජීවනෝපාය මුලපිරීම් මඟින් දිරිගන්වනසුලු ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. *'සිහින ගෙත්තම්', 'බලාපොරොත්තුවේ කපු කෙඳි', 'ජීවිතයට ආලෝකය', 'ඕෂන් ලීෆ්'*, සාම්ප්‍රදායික ආහාර සැකසුම්, අත්කම් සහ සූර්යය බලශක්ති පැනල නඩත්තුව පිළිබඳ කුසලතා පුහුණුව වැනි ව්‍යාපෘති මඟින් පෙන්නුම් කර ඇත්තේ එවැනි ප්‍රජා පාදක මැදිහත්වීම් ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ දිගුකාලීන ප්‍රකෘතිමත් වීම සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා අර්ථවත් ලෙස දායක වී ඇති බවයි. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද *'ඕෂන් ලීෆ්'* ව්‍යාපෘතිය ඇතුලු ව, මෙම වර්ෂය තුළ මන්නාරම දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද නව මුලපිරීම් මඟින් නවෝත්පාදනය සහ අන්තර්-ආයතනික සහයෝගීතාව වෙනුවෙන් මෙම කාර්යාලය සතු කැපවීම පිළිබිඹු වේ. අම්පාර සහ මන්නාරම ප්‍රදේශයන්හි පවුල් සඳහා ලබා දුන් මනෝ-සමාජීය සහයෝගය, හානිපූරණය කිරීම සඳහා අපගේ සමස්ත ප්‍රවේශය තවදුරටත් අවධාරණය කළේ ය. 2024–2025 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද එවැනි ප්‍රජා මූලික ජීවනෝපාය මුලපිරීම් මඟින් දිරිගන්වනසුලු ප්‍රතිඵල පෙන්නුම් කර ඇති අතර, ඒවා දිගුකාලීන ප්‍රකෘතිමත් වීම සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා අර්ථවත් ලෙස දායක වනු ඇත.

ඉහත සඳහන් කරන ලද සාමූහික හානිපූරණ කටයුතු වලට අමතර ව, දීර්ඝ කාලයක් තිස්සේ පැවති මූල්‍ය හානිපූරණ බැඳීම් සම්පූර්ණ කිරීම කෙරෙහි ද මෙම කාර්යාලය දැඩි අවධානයක් යොමු කරන ලදි. උතුරු නැගෙනහිර ගැටුම් සහ පාස්කු ඉරිදා ප්‍රහාරවලින් විපතට පත්වූවන් වෙනුවෙන් අනුමත කරන ලද සියලු ම මූල්‍ය හානිපූරණ ගෙවීම් මෙම වර්ෂය තුළ සාර්ථක ව නිම කිරීමට හැකි වූ බව මම සතුටින් ප්‍රකාශ කරමි. උතුරු නැගෙනහිර ගැටුම් හේතුවෙන් පීඩාවට පත් ප්‍රතිලාභීන් 2,043 දෙනෙකු වෙත රු. මිලියන 210 ක සමස්ත මුදලක් නිදහස් කර ඇති අතර, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන්ගේ අරමුදල යටතේ ප්‍රතිලාභීන් 663 දෙනෙකු අතර රු. මිලියන 310 ක මුදලක් බෙදා හැර ඇත. ඒ අනුව, නියමිත කාලසීමාවන් තුළ මෙම ක්‍රියාවලීන් නිල වශයෙන් නිම කිරීමට කටයුතු කර තිබේ.

අතුරුදහන් වූවන්ගේ පවුල් වෙත සහාය දැක්වීම ප්‍රධානතම ප්‍රමුඛතාවක් ලෙස තවදුරටත් පැවතිණි. මෙම වර්ෂය තුළ දී, පවුල් 685ක් වෙත රු. මිලියන 137ක මුදලක් මූල්‍ය හානිපූරණ ලෙස ලබා දී ඇති අතර, ඒ අනුව 2022 වර්ෂයේ සිට මේ දක්වා සහාය ලබා දී ඇති සමස්ත පවුල් සංඛ්‍යාව 4,460ක් දක්වා ඉහළ යයි. මෙම ගෙවීම්, එම පවුල් විසින් විඳින ලද දීර්ඝකාලීන පීඩාවන් නිල වශයෙන් පිළිගැනීමක් නිරූපණය කරන අතර, ඔවුන්ගේ අවශ්‍යතාවලට ගෞරවනීය සහ ස්ථාවර අයුරින් විසඳුම් සපයනු ලැබීම සඳහා රජය සතු වගකීම තවදුරටත් තහවුරු කරයි.

මූල්‍ය හා මෙහෙයුම් බාධාවන් මධ්‍යයේ වුව ද, කාර්යාලය ව්‍යක්තීයභාවයෙන් හා සංවේදීතාවයෙන් යුතු ව තම වගකීම් ඉටු කිරීම අඛණ්ඩ ව සිදු කිරීමට සමත් ව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ සමස්ත කාර්ය මණ්ඩලය දැක්වූ කැපවීම මෙන් ම, අදාළ විෂයභාර අමාත්‍යාංශ, දිස්ත්‍රික් පරිපාලන ව්‍යුහයන් සහ සංවර්ධන හවුල්කරුවන් විසින් ලබාදෙන ලද සහයෝගීතාව ද මම මෙහි දී ඇගයීමට ලක් කරමි. තව ද, හිටපු සභාපතිනිය සහ සාමාජිකයින් ඔවුන්ගේ නිල කාලය තුළ මෙම ආයතනය වෙත ලබාදුන් ආදර්ශමත් නායකත්වය සහ කැපවීමෙන් යුත් සේවය ද මම කෘතඥතාපූර්වකව අගය කිරීමට කැමැත්තෙමි.

අප 2026 අයවැය චක්‍රය වෙත පිවිසෙත්ම, ආයතනික පද්ධතීන් ශක්තිමත් කිරීමට, සාමූහික හානිපූරණ කටයුතු පුළුල් කිරීමට මෙන්ම මෙම හානිපූරණයන් සහන සැලසීම වෙනුවෙන් ම පමණක් නොව ගෞරවය, ප්‍රතිසන්ධානය සහ තිරසර සාමය උදෙසා ද දායක වන බව සහතික කිරීමට මෙම කාර්යාලය තවදුරටත් කැප වී සිටියි.

වසන්තා පෙරේරා

සභාපතිනිය

2. අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය

2025 වර්ෂය තුළ දී, හානිපූරණය සඳහා වන කාර්යාලය තම මෙහෙයුම් කටයුතු ශක්තිමත් කරන ලද අතර, ගැටුම්, සිවිල් නොසන්සුන්තා සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්වලට ලක්වූවන් වෙනුවෙන් විපතට පත් වූ පිරිස කේන්ද්‍ර කරගත් වන්දි සැපයීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදි. 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් මහපෙන්වීම ලබමින්, මෙම කාර්යාලය, විනිවිදභාවය, වගවීම සහ යහපාලනය උදෙසා තවදුරටත් කැප වී කටයුතු කළේ ය. දීර්ඝ කාලයක් තිස්සේ පැවති වන්දි ගෙවීම් සම්පූර්ණ කිරීමට හැකි වීම මෙහි දී අත්කරගත් ප්‍රධාන ජයග්‍රහණයක් විය. මෙම කාර්යාලය විසින් උතුරු නැගෙනහිර ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රතිලාභීන් 2,043 දෙනෙකු වෙත රු. මිලියන 210ක මුදලක් ද, අතුරුදහන් වූවන්ගේ පවුල් 685ක් වෙත රු. මිලියන 137ක මුදලක් ද නිදහස් කර ඇති අතර, ඒ අනුව 2022 වර්ෂයේ සිට මේ දක්වා සහාය ලබා දුන් සමස්ත පවුල් සංඛ්‍යාව 4,400කට වඩා අධික වේ. එමෙන් ම, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත්වූවන්ගේ අරමුදල කළමනාකරණය කරමින්, 2025 ජූනි මාසය වන විට ප්‍රතිලාභීන් 663 දෙනෙකු අතර රු. මිලියන 310ක මුදලක් බෙදා හැරීමට ද කටයුතු කර ඇත. මූල්‍ය වන්දි ලබාදීමට අමතර ව, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සාමූහික හානිපූරණ කටයුතු පුළුල් කිරීමට ද මෙම කාර්යාලය පියවර ගත්තේ ය. මෙම වැඩසටහන් මඟින් ප්‍රතිලාභීන්ගේ ආදායම් උත්පාදනය සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මනා පිටුවහලක් ලැබිණි. ජාත්‍යන්තර මට්ටමින්, මෙම කාර්යාලය ජිනීවා නුවර පිහිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් පිළිබඳ කමිටුව සමඟ සම්බන්ධ වී කටයුතු කළ අතර, එමඟින් විනිවිදභාවය සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් කෙරෙහි ශ්‍රී ලංකාව සතු කැපවීම මැනවින් පෙන්නුම් කරන ලදි. මූල්‍යමය සීමාවන් සහ කාර්ය මණ්ඩල අභියෝග මධ්‍යයේ වුව ද, වැඩිදියුණු කළ සම්බන්ධීකරණය සහ කාර්යක්ෂම සම්පත් කළමනාකරණය තුළින් කාර්යාලය ඵලදායී සේවා සැපයීමක් පවත්වාගෙන යන ලදි. ඉදිරිය දෙස බලන විට, තිරසර මෙන් ම පරිවර්තනීය ස්වභාවයකින් යුත් හානිපූරණ කටයුතු පුළුල් කිරීම, හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම, අධීක්ෂණ පද්ධතීන් තවදුරටත් නංවාලීම සහ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය වඩාත් ප්‍රශස්ත කිරීම කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරෙනු ඇත.

අවසාන වශයෙන්, 2025 වර්ෂයේ අත්කරගත් ජයග්‍රහණ මඟින් අර්ථවත්, වගකිවයුතු මෙන් ම තිරසර හානිපූරණයන් සැලසීම වෙනුවෙන් හානිපූරණය සඳහා වන කාර්යාලය සතු අඛණ්ඩ කැපවීම පිළිබිඹු වේ. මූල්‍ය ආධාර, ජීවනෝපාය ආධාර සහ ආයතනික පද්ධතීන් ශක්තිමත් කිරීම තුළින් පීඩාවට පත් පුද්ගලයන්ගේ සහ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවලට විසඳුම් සපයා ඇති මෙම කාර්යාලය, ඉදිරි වර්ෂයන්හි දී ප්‍රතිසන්ධානය, ඔරොත්තු දීමේ හැකියාව සහ සියලු දෙනා ඇතුළත් කරගත් සංවර්ධනය උදෙසා ශක්තිමත් පදනමක් දමා ගනිමින් සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත.

ජේ. ක්‍රිෂ්ණමූර්ති

අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී

3. ආයතනික පැතිකඩ පිළිබඳ දළ විශ්ලේෂණය

I. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව



වසන්තා පෙරේරා මහත්මිය - ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) - සභාපතිනිය (2025 නොවැම්බර් මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරිනියක වන වසන්තා පෙරේරා මහත්මිය, ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයක ස්ථිර ලේකම්වරියක ලෙස මෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කිරීම ඇතුළුව, ප්‍රමුඛ පෙළේ අමාත්‍යාංශ සහ ආයතන රැසක ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු හොබවා ඇත. රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් සංවර්ධනය සහ ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම යන ක්ෂේත්‍රයන් පුරා විහිදුණු ඇයගේ විශිෂ්ට සේවා කාලය තුළ ලබා ඇති ජයග්‍රහණ, UNESCO, USAID සහ GIZ වැනි ආයතනවල ඇගයීමට ලක්ව තිබේ. ඇය දැනට South Asia Foresight Networkහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවක ලෙස කටයුතු කරන අතර, නායකත්වය සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ බණ්ඩාරනායක ඇකඩමියේ (BALPP) අධ්‍යයන සම්මේලනයේ සාමාජිකාවක ලෙස සේවය කරයි.



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු මහතා - සාමාජික
(2024 අගෝස්තු මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදි)

ශ්‍රී ලංකා යුද හමුදාවේ විශ්‍රාමික නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් ප්‍රනාන්දු මහතා, 1971 සිට 2015 දක්වා කාලය තුළ හමුදා සේවයේ නිරත වෙමින් මේජර් ජෙනරාල් නිලය දක්වා උසස්වීම් ලැබූ අතර, ප්‍රමුඛ පෙළේ අණදෙන සහ ආරක්ෂක සම්බන්ධීකරණ තනතුරු රැසක් හොබවා ඇත. ඔහු වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කර ඇති අතර, ආසියානු මලල ක්‍රීඩා සංගමයේ සභා සාමාජිකයෙකු සහ දකුණු ආසියානු මලල ක්‍රීඩා සම්මේලනයේ උප සභාපතිවරයා ලෙස ක්‍රීඩා පරිපාලන කටයුතු සඳහා ද සිය සක්‍රීය දායකත්වය අඛණ්ඩව ලබා දෙයි.



රියර් අද්මිරාල් (විශ්‍රාමික) ටෙරන්ස් සුන්දරම් - සාමාජික
(2025 නොවැම්බර් 06 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි)

ශ්‍රී ලංකා නාවික හමුදාවේ විශිෂ්ට සේවයක නිරත වූ රියර් අද්මිරාල් (විශ්‍රාමික) ටෙරන්ස් සුන්දරම් මහතා, ප්‍රධාන නාවික විධාන කිහිපයකම අණදෙන නිලධාරියා ලෙස කටයුතු කර ඇති අතර නාවික හා සාගරික විද්‍යා පීඨයේ (NMA) ප්‍රධානියා ලෙස ද නායකත්වය ලබා දී ඇත. විශිෂ්ට සේවා විභූෂණ (WVS) සම්මානයෙන් පිදුම් ලබා ඇති ඒ මහතා, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU), ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සහ බලශක්ති ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවමින් ජාතික සංවර්ධනය සඳහා සිය දායකත්වය අඛණ්ඩව ලබා දී ඇත.



සංජීව විමලගුණරත්න මහතා - සාමාජික
(2025 නොවැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි)

සංජීව විමලගුණරත්න මහතා රාජ්‍ය අංශය, ජාත්‍යන්තර ආයතන සහ ආයතනික ක්ෂේත්‍රය පුරා විහිදුණු වසර 18 කට අධික ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්දක් සතු නිලධාරියෙකි. රාජ්‍ය නොවන සංවිධාන (NGO) නියාමනය, ඩිජිටල් පරිවර්තනය, හානිපූරණ සහ ප්‍රතිසන්ධාන කටයුතු සම්බන්ධ ප්‍රධාන මූලපිරීම් සඳහා ඔහු නායකත්වය ලබා දී ඇති අතර, පාලනය සහ ආරක්ෂාව පිළිබඳ ජාතික කමිටුවල ද සේවය කර ඇත. ඔහු ආදිශිෂ්‍ය සංගම්වල නායකත්වය මෙන්ම පාර්ශවකරුවන් සම්බන්ධීකරණය පිළිබඳ සිය විශේෂඥ දැනුම මඟින් ද සිය දායකත්වය අඛණ්ඩව ලබා දෙයි.



නසීහා අන්සාර් මහත්මිය - සාමාජිකාව
(2025 නොවැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදි)

නසීහා අන්සාරි මහත්මිය සමාජ විද්‍යාඥවරියක, පර්යේෂිකාවක මෙන් ම ශාස්ත්‍රීය ක්ෂේත්‍රය, සමාජ පර්යේෂණ සහ බිම් මට්ටමේ ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳ දශකයකට අධික පළපුරුද්දක් ඇති ප්‍රජා සංවර්ධන නිලධාරිනියකි. කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් හදාරමින් සිටින ඇය, බාහිර කථිකාචාර්යවරියක ලෙස කටයුතු කරන අතර, මනෝසමාජයීය සහයෝගය සහ පර්යේෂණ සඳහා වන මධ්‍යස්ථානයේ (Centre for Psychosocial Support and Research) නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරිනිය ද වේ. කාන්තාවන්, ළමුන්, සංක්‍රමණිකයන් සහ ප්‍රජා සවිබල ගැන්වීම් යන ක්ෂේත්‍රයන්හි සමාජ සාධාරණත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැඟීම කෙරෙහි දැඩි කැපවීමකින් යුතුව කටයුතු කරන ඇයගේ සේවය, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සහයෝගීතාවයන් රැසක් පුරා විහිදී පවතී.

II. පනත යටතේ පැවරී ඇති බලතල

හානිපූරණය සඳහා වන කාර්යාලය, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ ප්‍රතිපාදන යටතේ, ගැටුම් සහ සිවිල් නොසන්සුන්තා හේතුවෙන් පීඩාවට පත් වූ තැනැත්තන් හඳුනාගෙන ඔවුන් වෙත සුදුසු හානිපූර්ණ ක්‍රියාමාර්ග සැලසීම සඳහා බලය පැවරුණු ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවන ලදි.

හානිපූරණය සඳහා වන කාර්යාලය, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත ප්‍රකාරව පිහිටුවන ලදි. උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති සන්නද්ධ ගැටුම හෝ එහි ප්‍රතිඵලයක් ලෙස; නැතහොත් දේශපාලන නොසන්සුන්තාවන් හෝ සිවිල් කැළඹීම් හේතුවෙන්; හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමක් හේතුවෙන් සිදු වූ ජීවිත හානි, පුද්ගල තුවාල හෝ දේපළ හානිවලට ලක්වීම නිසා හෝ ඊට අනුගාමීව හෝ ඊට අදාළව හානියට පත් වූ තැනැත්තන් පීඩාවට පත් වූවන්ගේ ගණයට ඇතුළත් වේ. ඉහත සඳහන් කළ තත්ත්වයන් යටතේ මියගිය තැනැත්තන්ගේ හෝ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් ද මීට ඇතුළත් වේ.

පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව, පීඩාවට පත් වූවන් ලැබූ හානිය පිළිගැනීම ප්‍රවර්ධනය කරන අතරතුර, හානිපූර්ණයන් නිර්දේශ කිරීම සහ පරිපාලනය කිරීම ද, ප්‍රතිෂ්ඨාපනය, වන්දි ලබා දීම, පුනරුත්ථාපනය සහ නැවත සිදු නොවන බවට වන සහතිකයන් සඳහා වන යාන්ත්‍රණයන් සක්‍රීය කිරීමේ වගකීම ද මෙම කාර්යාලය වෙත පැවරී ඇත.

හානිපූර්ණයන්ට අදාළ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, හිමිකම් පෑම් ලබා ගැනීම සහ ඒවා සැකසීම, පරීක්ෂණ පැවැත්වීම, පීඩාවට පත් ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීම සහ විපතට පත්වූවන්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය සුරැකීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා මෙම කාර්යාලය වෙත තවදුරටත් බලය පැවරී ඇත.

තමන් සතු ව්‍යවස්ථාපිත කාර්යභාරයන් ඉටු කිරීම මඟින්, මෙම කාර්යාලය ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානය, ප්‍රතිෂ්ඨාපන යුක්තිය සහ තිරසර සාමය උදෙසා අඛණ්ඩව දායකත්වය සපයයි.

III. දැක්ම සහ මෙහෙවර

දැක්ම.....

"සාධාරණ හා පරිවර්තනීය හානිපූරණයන් හරහා ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීම"


මෙහෙවර.....

"අනාගත පරපුර ඇතුළුව සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට පුළුල් හානිපූරණ යෝජනා ක්‍රමයක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම"

IV. සංවිධාන ව්‍යුහය

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව

සංවිධාන ව්‍යුහය



V. පාලන ව්‍යුහය

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යටතේ ස්ථාපිත කර ඇති හානිපූරණය සඳහා වන කාර්යාලය, පනතේ විස්තර කර ඇති පරිදි මෙරට පීඩාවට පත් පුද්ගලයින් සඳහා සුදුසු වන්දි ගෙවීම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ නිර්දේශ කිරීම සඳහා බලය පවරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම කාර්යාලයේ පාලන ව්‍යුහය මඟින් ස්වාධීනත්වය, වගවීම, විනිවිදභාවය සහ පීඩාවට පත් ප්‍රජාවන් කෙරෙහි දක්වන ප්‍රතිචාරාත්මකභාවය තහවුරු කරයි.

කාර්යාලයේ උපායමාර්ගික මහපෙන්වීම සහ සමස්ත පාලනය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත පැවරී ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් (05) අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.
- සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර, ප්‍රතිපත්තිමය මහපෙන්වීම් සහ ආයතනික කාර්ය සාධනය අධීක්ෂණය කරයි.
- සාමාජිකයන් විසින් සාමූහිකව ප්‍රතිපත්තිමය රාමු තීරණය කිරීම, මෙහෙයුම් සැලසුම් අනුමත කිරීම සහ පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත බලතල සමඟ ඒවා අනුකූල වන බව තහවුරු කිරීම සිදු කරනු ලබයි.
- ප්‍රගතිය සමාලෝචනය කිරීම, වැඩසටහන් අනුමත කිරීම සහ උපායමාර්ගික මහපෙන්වීම් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් රැස්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීනව ක්‍රියාත්මක වන අතර, වාර්ෂික වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මඟින් පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටියි.

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කරනු ලැබුවේ 2025.10.24 දින දී ය. මීට පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සිව්දෙනාගේ ධුර කාලය 2025 මැද භාගයේ දී අවසන් විය. පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පහත පරිදි වේ:

1.	නීතිඥ ධාරා විජයතිලක මහත්මිය	- සභාපතිනිය, (2022 ජූනි 12 සිට 2025.06.12 දක්වා නැවත පත් කරන ලදි)
2.	ආචාර්ය අසීස් මුබාරක්	- සාමාජික (2022.07.06 සිට 2025.07.05)
3.	නීතිඥ රසික දිසානායක මහතා	- සාමාජික (2022.07.06 සිට 2025.07.05)
4.	නීතිඥ ප්‍රියා සිවගනනාදන් මහත්මිය	- සාමාජික (2022.08.06 සිට 2025.08.05)
5.	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු	- සාමාජික (2024 අගෝස්තු 12 දින නැවත පත් කරන ලදි)

විධායක කළමනාකරණය

කාර්යාලයේ දෛනික පරිපාලන කටයුතු කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී විසින් වන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා වගකියනු ලබයි.

විධායක කළමනාකරණ කණ්ඩායම අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වන අතර, ඊට පහත සඳහන් ප්‍රධාන අංශවල ප්‍රධානීහු ඇතුළත් වෙති:

- මූල්‍ය සහන අංශය
- මූල්‍ය අංශය
- පරිපාලන අංශය
- ජීවනෝපාය සහාය අංශය
- මනෝ සමාජීය සහාය අංශය

මෙම ව්‍යුහය මඟින් ඵලදායී සම්බන්ධීකරණය, සේවා කාලෝචිත ලෙස සැපයීම සහ මහජන අරමුදල් නිසි ලෙස කළමනාකරණය කිරීම සහතික කරයි.

4. මෙහෙයුම් පරිසරය

i. ක්ෂේත්‍ර ප්‍රවණතා සහ වර්ධනයන්

2025 වර්ෂයේදී, හානිපූරණය සඳහා වන කාර්යාලයේ ක්‍රියාකාරී වටපිටාව කෙරෙහි සංක්‍රාන්ති යුක්තියේ ප්‍රමුඛතා විකාශනය වීම සහ වින්දිතයින් කේන්ද්‍ර කරගත් සේවා සැපයීම සම්බන්ධයෙන් වූ වැඩි වන අපේක්ෂාවන් බලපාන ලදි. විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන් වෙනුවෙන් සාමූහික හානිපූරණය, ජීවනෝපාය ප්‍රතිස්ථාපනය, මනෝ-සමාජයීය සහයෝගීතාව ඒකාබද්ධ කිරීම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී වන වැඩසටහන් කෙරෙහි වැඩි අවධාරණයක් යොමු විය. ශක්තිමත් කරන ලද අධීක්ෂණ සහ ඇගයීම් රාමු, ඩිජිටල් වාර්තා කළමනාකරණය සහ ප්‍රතිඵල පාදක කරගත් සැලසුම්කරණය ක්ෂේත්‍රයේ වැදගත් ප්‍රවණතාවන් බවට පත් වූ අතර, එමඟින් පුළුල් රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ මෙන් ම විනිවිදභාවය, වගවීම සහ මැනිය හැකි බලපෑමක ඇති අවශ්‍යතාවය ද පිළිබිඹු විය. තිරසරභාවය, ප්‍රජා සහභාගිත්වය සහ ජාතික ප්‍රතිසන්ධාන අරමුණු සමඟ අනුකූල වීම වෙනුවෙන් සංවර්ධන හවුල්කරුවෝ අඛණ්ඩව පෙනී සිටියහ.

ii. ප්‍රධාන පාර්ශවකරුවන්

කාර්යාලය 2025 වර්ෂය පුරා විවිධ පාර්ශවකරුවන් පිරිස් සමඟ කටයුතු කළේ ය. මූලික පාර්ශවකරුවන්ට ගැටුම්වලින් පීඩාවට පත් වූවන් සහ ඉන් දිවි ගලවා ගත් තැනැත්තන්, අතුරුදහන් වූවන්ගේ පවුල්, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ වන්දි සඳහා සුදුසුකම් ලබන ආන්තික ප්‍රජාවන් ඇතුළත් විය. ආයතනික පාර්ශවකරුවන් අතර රේඛීය අමාත්‍යාංශ, මුදල් අමාත්‍යාංශය, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ද, පාර්ලිමේන්තුව සහ විගණකාධිපති වැනි අධීක්ෂණ ආයතන ද ඇතුළත් විය. සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා පාදක සංවිධාන, කාන්තා කණ්ඩායම් සහ ආගමික නායකයින්, සබඳතා සහ විශ්වාසය ගොඩනැගීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. ජීවනෝපාය සහ මනෝ-සමාජයීය මුලපිරීම් සඳහා තාක්ෂණික සහාය සහ විභව මූල්‍ය ආධාර සැපයීමේ දී ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සහ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල ද ප්‍රධාන සහයෝගීතාකරුවන් ලෙස අඛණ්ඩව කටයුතු කළහ.

iii. ආර්ථික හා දේශපාලන පරිසරය

2025 වර්ෂයේ පැවති ආර්ථික හා දේශපාලනික වටපිටාව සංකීර්ණ මෙන් ම ප්‍රතිසංස්කරණ කේන්ද්‍ර කරගත් එකක් ලෙස පැවතුණි. මූල්‍ය ඒකාබද්ධතා ක්‍රියාමාර්ග, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සහ ජීවන වියදම් පීඩනයන්, අයවැය ප්‍රතිපාදන සහ ව්‍යාපෘති කාලසීමාවන් කෙරෙහි අඛණ්ඩව බලපෑම් එල්ල කළේය. උද්ධමනකාරී ප්‍රවණතා සහ සීමිත රාජ්‍ය වියදම් හේතුවෙන් ඉහළ බලපෑමක් සහිත සහ පිරිවැය ඵලදායී මැදිහත්වීම් සඳහා ප්‍රමුඛතාව ලබා දීමට කාර්යාලයට සිදු විය. දේශපාලනික වශයෙන් ගත් කල, පාලන ප්‍රතිසංස්කරණ සහ ව්‍යවස්ථාපිත ආයතන කෙරෙහි මහජන පරීක්ෂාව දැඩි වීම මෙම වසරේ කැපී පෙනුණු අතර, එමඟින් අපක්ෂපාතීත්වය, විනිවිදභාවය සහ ආයතනික විශ්වසනීයත්වයේ ඇති අවශ්‍යතාව තහවුරු විය. මෙම සන්දර්භය තුළ, කාර්යාලය ජාතික ප්‍රතිපත්තිමය මහපෙන්වීම් වලට ප්‍රවේශමෙන් අනුගත වෙමින් ක්‍රියාත්මක වූ අතර, සාධාරණ හා අපක්ෂපාතී අයුරින් හානිපූරණ යුක්තිය ඉටු කිරීම සඳහා වන සිය ව්‍යවස්ථාපිත බලතල ද මැනවින් පවත්වා ගෙන ගියේ ය.

5. කාර්යසාධන දළ විශ්ලේෂණය

I. හානිපූරණ වැඩසටහන

හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) පනත යටතේ සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති සහ රාමුවලට අනුකූල ව, පුද්ගලික මෙන්ම සාමූහික යන දෙඅංශයෙන්ම හානිපූරණයන් සපයනු ලැබේ. හානිපූරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් මැදිහත් විය යුතු තේමාත්මක ක්ෂේත්‍ර අටක් (08) හඳුනා ගනු ලබයි. පීඩාවට පත් වූ තැනැත්තන් වෙත සහන සහ හානිපූරණයන් සැපයීමේ දී, හානිපූරණය සඳහා වන කාර්යාලය එහි ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවල සඳහන් කර ඇති මාර්ගෝපදේශ දහයක් (10) අනුගමනය කරනු ලබයි.

1 ජීවනෝපාය සහාය
2 වන්දි සහ මූල්‍යමය සහාය
3 ඉඩම් අයිතිවාසිකම් ප්‍රතිෂ්ඨාපනය
4 නිවාස සැපයීම
5 ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
6 පරිපාලන සහන
7 මනෝ සමාජීය සහාය
8 සමගිය, ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචණ්ඩත්වය නැවත සිදුවීම වැළැක්වීමේ ක්‍රියාමාර්ග

ඉහත සඳහන් ප්‍රතිපත්තිමය ක්ෂේත්‍ර අතුරින්, හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) දැනට ක්ෂේත්‍ර තුනකට ප්‍රමුඛතාව ලබා දෙයි: **(i) වන්දි සහ මූල්‍යමය සහාය, (ii) ජීවනෝපාය සහාය, සහ (iii) මනෝ-සමාජයීය සහාය**.

i. මූල්‍යමය වන්දි ප්‍රදානය.

අ. අතුරුදහන් වූවන්ගේ පවුල් / යැපෙන්නන්ට මූල්‍යමය ආධාර ලබා දීම.

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙන් (OMP) ලැබුණු නිර්දේශ මත පදනම් ව, 2025 ජනවාරි සිට පවුල් / යැපෙන්නන් 685 දෙනෙකුට (2024 දී ලැබුණු නිර්දේශ 122 ක් ඇතුළුව) රු. 200,000 බැගින් වූ මූල්‍ය ආධාර ලබා දී ඇත. 2025 වර්ෂය තුළ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙන් වන්දි ගෙවීමේ කාර්යාලයට නිර්දේශ 563 ක් ලැබුණි. ඒ අනුව, 2022 සිට 2025.12.31 දක්වා අතුරුදහන් වූවන්ගේ පවුල් 4,456 කට මූල්‍යමය ආධාර ලබා දී ඇත.

ආ. උතුරු - නැගෙනහිර ගැටුමෙන් පීඩාවට පත් පුද්ගලයින්ට මූල්‍යමය ආධාර ලබා දීම.

උතුරු - නැගෙනහිර ගැටුම හේතුවෙන් මරණයට, තුවාල ලැබීමට සහ දේපළ හානිවලට ලක් වූ වින්දිතයින් 2,043 දෙනෙකුට මූල්‍ය ආධාර ලබා දී ඇත. 2025 සැප්තැම්බර් මාසය වන විට උතුරු - නැගෙනහිර විපතට පත් වූවන් සඳහා වූ සියලුම වන්දි ගෙවීම් සම්පූර්ණ කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලයට හැකි විය.

2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුල්‍යමය සහන ලබා දීම.

යෝජනා ක්‍රමය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.මි.)
අතුරුදහන් වූවන්ගේ පවුල්	685	137
උතුරු - නැගෙනහිර ගැටුම්	2,043	210

හානිපූරණය සඳහා වන කාර්යාලය 1989 වසරේ සිට පසුගිය දශක හතරක කාලය පුරා ලැබී තිබූ සියලුම හිඟ අයදුම්පත් පියවමින්, ගෙවීමට තිබූ සියලුම වන්දි ගෙවීම් 2025 සැප්තැම්බර් මාසය වන විට සාර්ථකව නිම කරන ලදි.

ඇ. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත් වූවන් සඳහා වන වින්දිත අරමුදල හරහා ගෙවීම් සිදු කිරීම.

ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත්වලට අදාළ ව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 ජනවාරි 12 වැනි දින ලබා දුන් තීන්දුවේ නියෝගයන්ට අනුකූල වීම සඳහා, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් '2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරය - වින්දිත අරමුදල' පිහිටුවන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුකූල ව, වගඋත්තරකරුවන් 06 දෙනෙකු විසින් සාමූහිකව රු. මිලියන 311ක සමස්ත මුදලක් මෙම විපතට පත්වූවන්ගේ අරමුදල වෙත බැර කරන ලදි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරන ලද පරිදි, අරමුදල සඳහා දායක වන ලෙස පරිත්‍යාගශීලීන්ගෙන් ඉල්ලා සිටිමින් පුවත්පත් දැන්වීම් පළ කළ ද, එවැනි කිසිදු මුදල් ප්‍රේෂණයක් නොලැබුණි. එබැවින් විපතට පත්වූවන් වෙත බෙදා හැරීම සඳහා අරමුදලේ පැවති මුළු මුදල වූයේ වගඋත්තරකරුවන් විසින් ගෙවන ලද මුදල පමණි.

- **පවුලේ සාමාජිකයෙකුගේ මරණය වෙනුවෙන් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත් වූවන්ගේ වින්දිත අරමුදලෙන් ළඟම ඥාතීන් වෙත සිදු කරන ලද ගෙවීම්**

අ) ආරම්භයේ දී, එම අවස්ථාව වන විට චින්දිත අරමුදලේ පැවති මුදල් සීමිත වූ බැවින්, මියයන අවස්ථාවේ දී වයස අවුරුදු 18 හෝ ඊට වැඩි වූ අයගේ පවුල් වෙත රු. 175,000/= ක මුදලක් ගෙවන ලද අතර, පසුව තවත් මුදල් ලැබීමත් සමඟ, මියයන අවස්ථාවේ දී වයස අවුරුදු 18 ට අඩු වූ අයගේ පවුල් වෙත රු. 75,000/= ක මුදලක් ගෙවන ලදි. මෙම මුදල් ළඟම ඥාතීන් අතර බෙදා දෙන ලදි.

ආ) පසු ව, චින්දිත අරමුදල වෙත තවත් අරමුදල් ලැබීමත් සමඟ, මියගිය එක් එක් තැනැත්තාගේ පවුල වෙත රු. 250,000/= ක අතිරේක මුදලක් ගෙවන ලදි. මෙම මුදල ළඟම ඥාතීන් අතර බෙදා දෙනු ලැබුවේ ගෙවනු ලබන අවම මුදල රු. 125,000/= කට යටත්ව ය.

ද්විතීයික අධ්‍යාපන සහාය යෝජනා ක්‍රමයට (SESS) ඇතුළත් කර ඇති ශිෂ්‍යයන්ගේ ළඟම ඥාතීන්ට හිමි විය යුතු බෙදා වෙන් කළ කොටස, ඔවුන්ගේ SESS දීමනාවට එකතු කරන ලදි.

- **වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් තුවාල වූවන්ට සිදු කරන ලද ගෙවීම්**

අඛණ්ඩ ව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය වන සෞඛ්‍ය තත්ත්වයන් පවතින්නේ නම්, මූල්‍යමය සහන ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස මීට පෙර ගෙවීම් ලබා සිටි තුවාල ලැබූ පුද්ගලයන්ගෙන් හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) ඉල්ලා සිටින ලදි.

වර්තමාන තත්ත්වය දැක්වෙන නව වෛද්‍ය සහතික සමඟ ලැබුණු අයදුම්පත්, නිර්දේශ ලබා ගැනීම සඳහා වෛද්‍ය වෘත්තිකයන්ගෙන් සමන්විත මණ්ඩලයක් වෙත යොමු කරන ලදි. මෙම මණ්ඩලය පත් කරනු ලැබුවේ හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) විසින් කරන ලද ඉල්ලීමකට අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසිනි.

වැඩිදුර වෛද්‍ය නිර්දේශ නොමැතිව ලබා දිය හැකි සහන (උදා: ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර සඳහා ඉල්ලීම්) ලබා දෙන ලදි.

වෛද්‍ය වෘත්තිකයන්ගෙන් සමන්විත මණ්ඩලයේ නිර්දේශ මත පදනම් ව, තුවාල සඳහා වන ගෙවීම් 2025 පෙබරවාරි මාසයේ සිට ආරම්භ කරනු ලැබේ.

- **ද්විතීයික අධ්‍යාපන යෝජනා ක්‍රමය යටතේ සිසුන් සඳහා සිදු කරන ප්‍රදාන.**

1. ද්විතීයික අධ්‍යාපන සහාය සඳහා සිසුන් 50 දෙනෙක් හඳුනාගන්නා ලදි. සියලු ම දරුවන්, මිය ගිය පුද්ගලයන්ගේ හෝ සදාකාලික පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූවන් හෝ සිදු වූ තුවාල හේතුවෙන් සෘජුවම බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ දරුවන් විය.

2. ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් හඳුනාගන්නා ලද දෙමාපියන් හෝ භාරකරුවන් හානිපූරණය සඳහා වන කාර්යාලයේ නිලධාරීන් හමු වී යෝජිත යෝජනා ක්‍රම පිළිබඳව සාකච්ඡා කර ඇත.

3. ප්‍රතිචාර සහ අවශ්‍යතා තක්සේරුව මත පදනම්ව, එක් එක් ශිෂ්‍යයා සඳහා වන යෝජනා ක්‍රමය තීරණය කරන ලදි.

4. ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා ඔවුන්ට සහාය විය යුතු වසර ගණනින් ගුණ කිරීමෙන් ලැබෙන රු. 250,000/=ක මුදලක් සෑම සිසුවෙකුට ම ලබා දීමට තීරණය කරන ලදි. සමහර ශිෂ්‍යයන්ට අදාල විශේෂ තත්ත්වයන් සලකා බැලීමෙන් පසු ව ඔවුන්ගේ ආධාර මුදල තීරණය කරන ලදි.

5. හානිපූරණය සඳහා වන කාර්යාලය බැංකු කිහිපයකින් පොලි අනුපාත ලබා ගත් අතර ආර්ථික වශයෙන් වඩාත් වාසිදායක දිමනාව පිළිබඳ ව දෙමාපියන්ට / භාරකරුවන්ට උපදෙස් දී, ඔවුන් කැමති බැංකුව තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන ලදි. සියළු දෙනා හැටන් නැෂනල් බැංකුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රමය තෝරා ගත්හ.

6. ආධාර මුදලේ ප්‍රමාණය සහ පාසල් අධ්‍යාපනයේ වසර ගණන මත පදනම් ව ආයෝජන යෝජනා ක්‍රම 3ක් හඳුනා ගන්නා ලදි.
   - අ) පෙර පාසලේ සිට 7 ශ්‍රේණිය දක්වා සිසුන් සඳහා යෝජනා ක්‍රමය
   - ආ) 8 ශ්‍රේණියේ සිසුන් සඳහා යෝජනා ක්‍රමය
   - ඇ) 9 ශ්‍රේණියේ සිට උසස් පෙළ සිසුන් දක්වා වූ යෝජනා ක්‍රමය

7. අදාළ ගිණුම කළමනාකරණය සඳහා වගකීම මව්පියන් හෝ හඳුනා ගත් භාරකරුවෙකු වෙත ලබා දෙන ලදි.

8. මෙම යෝජනා ක්‍රම මඟින් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා මාසික ප්‍රේෂණයක් සහතික කරන ලදි.

9. කිසියම් දෙමාපියෙක් මාසික ප්‍රේෂණ අවශ්‍ය නොවන බව දැනුම් දුන්නේ නම්, ප්‍රදාන මුදල දිගු කාලීන ආයෝජනයක (එනම් වසර 18 දක්වා) තැන්පත් කරන ලදි.

10. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හැටන් නැෂනල් බැංකුව සහ දෙමාපියන් භාරකරුවන් සමඟ කටයුතු කළ අතර, සෑම බාලවයස්කාර දරුවකු සඳහාම ළමා ඉතුරුම් ගිණුම් සහ ශිෂ්‍යයාගේ නමින් ස්ථාවර තැන්පතු, මාසික පොලී පදනම මත සහ කල් පිරීමේ පදනම මත වසර 1 සිට 3 දක්වා කාල සීමාවන් සඳහා ලබා දෙන ලදි.

සියලු ම තීරණ දරුවාගේ පරම යහපත යන මූලධර්මය අනුව ගනු ලැබූ අතර, මෙම මූලධර්මය පිළිපැදීමට දෙමාපියන් / භාරකරුවන් පොරොන්දු විය.

- **තෘතියික අධ්‍යාපනය සඳහා සහාය**

අයදුම්පත් ඇගයීම මත මූල්‍ය සහන ලබා දෙන ලදි.
ඒ අනුව, වින්දිත අරමුදලෙන් ප්‍රතිලාභීන් වෙත සිදු කරන සියලුම ගෙවීම් 2025 ජූනි මාසය වන විට සාර්ථක ව නිම කර අවසන් කරන ලදි.
වින්දිත අරමුදලට ලැබුණු මුළු මුදල = රු. මිලියන 311
වින්දිත අරමුදලෙන් ප්‍රතිලාභීන්ට ලබා දුන් මුළු සහන (මුළු එකතුව) = රු. මිලියන 310
මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව = 663

ii. ජීවනෝපාය සහාය වැඩසටහන

අ. සිහින ගෙත්තම් (Stitching Dreams), මන්නාරම

මෙම වැඩසටහන 2025.12.12 දින මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගර කොට්ඨාශයේ තරුණියන් 30 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහනට විසිතුරු එම්බ්‍රොයිඩර් පිළිබඳ දින 20ක පුහුණුවක්, මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම සහ අවශ්‍ය පුහුණු උපකරණ සැපයීම ඇතුළත් විය. ප්‍රතිලාභීන් වැඩසටහන සාර්ථක ව නිම කළහ. වැඩසටහනේ පිරිවැය රු. 195,395 කි.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගර කොට්ඨාසයේ තරුණ කාන්තාවන් 30 දෙනෙකුට විසිතුරු එම්බ්‍රොයිඩර් (Ari) නිර්මාණකරණය සහ නිෂ්පාදනය පිළිබඳ දැනුම සහ තාක්ෂණික කුසලතා පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දීම මඟින්, ඔවුන්ට ආදායම් උපයා ගැනීමට හැකිවන පරිදි සවිබල ගැන්වීමයි.

ආ. ඕෂන් ලීෆ් (OceanLeaf) ජීවනෝපාය සහාය මූලපිරීම්, මන්නාරම

මන්නාරමේ නානාවිටත් කොට්ඨාශයේ ගැටුමෙන් පීඩාවට පත් පවුල් 8ක් සවිබල ගැන්වීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) සමඟ සහයෝගයෙන් හරිත ඇල්ගී වගා කිරීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනක් 2026 ජනවාරි මාසයේ දී දියත් කිරීමට සූදානම් කර ඇත. එහි ඇස්තමේන්තු පිරිවැය ආසන්න වශයෙන් රු. මිලියන 1 ක් පමණ වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මන්නාරමේ නානාවිටත් හි ගැටුම් වලින් පීඩාවට පත් පුද්ගලයින් අට දෙනෙකු වෙත තාක්ෂණික පුහුණුව, ආරම්භක යෙදවුම් සැපයීම සහ අලෙවිකරණ පහසුකම් සමඟ සම්බන්ධ කිරීම තුළින් පූර්ණ ක්‍රියාකාරී කුඩා පරිමාණ සාගර ඇල්ගී වගා ඒකක පිහිටුවීමට සහාය වීමයි.








iii. මනෝසමාජීය සහාය වැඩසටහන

මනෝසමාජීය සහාය වැඩසටහන යටතේ, අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 5ක අවශ්‍යතා හඳුනාගෙන, අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කිරීමෙන්, ඔවුන්ට අවශ්‍ය සේවාවන් සාර්ථකව ලබා දෙන ලදි. "අස්වැසුම" ආධාර ලබා ගැනීමට පුද්ගලයින් 3 දෙනෙකුට සහාය වීම සහ එක් පුද්ගලයෙකුට වෙළඳපල පහසුකම් සහ ආබාධිත දීමනා ලබා ගැනීම මෙයට ඇතුළත් විය.

මන්නාරම දිස්ත්‍රික්කයේ, පවුල් 3ක් ඔවුන්ගේ අවශ්‍යතා ලබා ගැනීම සඳහා අදාළ රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමු කරන ලද අතර, පසුව ඒවා ඉටු කරන ලදි. අධ්‍යාපන පහසුකම්, නිවාස පහසුකම් සහ ඔවුන්ගේ ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම මෙයට ඇතුළත් විය.

iv. ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් වෙත වාර්තා ඉදිරිපත් කිරීම

- මානව හිමිකම් කවුන්සිලයේ 60 වැනි සැසිවාරය සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් 2025 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ගැටලු / විමසීම් සඳහා ප්‍රතිචාර වශයෙන් වාර්තා සපයන ලදි.
- බලහත්කාරයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කමිටුව (CED) විසින් ඉදිරිපත් කරන ලද ගැටලු / විමසීම් වලට අදාළ වාර්තා ඉදිරිපත් කළ අතර, 2025 සැප්තැම්බර් 26 වැනි දින ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී පැවැත්වුණු එම කමිටු සැසිවාරයට ද සහභාගී විය.

v. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය ආධාර වැඩසටහන් 17 ක් සඳහා අධීක්ෂණ සහ පසු විපරම් කටයුතු සිදු කරන ලදි. 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා කාලය තුළ දියත් කරන ලද ව්‍යාපෘතිවල ආදායම් උත්පාදන කටයුතු ආරම්භ කර තිබූ අතර, ප්‍රගතිය පහත පරිදි විය.

අ. සිහින ගෙත්තම් - යාපනය

යාපනයේ සන්දිලිපායි කොට්ඨාශයේ තරුණ කාන්තාවන් 40 දෙනෙකුට විසිතුරු එම්බ්‍රොයිඩර් සහ පුහුණු උපකරණ පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දුන් අතර, පුහුණු මධ්‍යස්ථානය සඳහා මහන මැෂින් හයක් (06) ද ලබා දෙන ලදි. ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 1.36 කි.

මෙම වැඩසටහන මඟින් යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස් හි තරුණ කාන්තාවන් 20 දෙනෙකුට ඔවුන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා පුහුණුව, පුහුණු ද්‍රව්‍ය සහ මහන මැෂින් 5 ක් ලබා දෙන ලදි. ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 0.61 කි.

වර්තමානය වන විට, ප්‍රතිලාභීන් විසින් දළ වශයෙන් රු. 15,000ක සාමාන්‍ය මාසික ආදායමක් උපයා ගැනීමට සමත් වී ඇත.





ආ. බලාපොරොත්තුවේ කපු කෙඳි - මඩකලපුව සහ අම්පාර

- යුද්ධයෙන් පීඩාවට පත්, මන්මුනේපත්තු, මන්මුනේයි දකුණ සහ එරාවුර් පත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි සාම්ප්‍රදායික අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයින් 89 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් දහතුනක් (13ක්) සඳහා, ඔවුන්ගේ සුළු පරිමාණ අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය පුළුල් ලෙස නැවත ආරම්භ කිරීමට හැකි වන පරිදි අමුද්‍රව්‍ය, පුහුණුව සහ දැනුවත් කිරීම්, වෙළඳපල අවස්ථා සහ 'වැප්රෝල්' (Waproll) යන්ත්‍ර දෙකක් ලබා දෙමින් සහයෝගය දක්වන ලදි. මෙම ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 2.42 කි.


- අම්පාර දිස්ත්‍රික්කයේ නවිදන්වෙලි කොට්ඨාසයේ ගැටුම්වලින් පීඩාවට පත් පුද්ගලයන් 38 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් තුනක අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සවිබල ගැන්වීම සහ නංවාලීම සඳහා අවශ්‍ය සහය ලබා දෙමින් ආධාර කරන ලදි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 0.66 කි.


මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් ඉතා සාර්ථක ලෙස ආදායම් උත්පාදන කටයුතුවල නිරත වෙති. ඔවුහු තම මාසික ආදායම සැලකිය යුතු ලෙස වැඩි කර ගෙන ඇත.













ඇ. ජීවිතයට ආලෝකය - මඩකලපුව සහ අම්පාර

මඩකලපුවේ මන්මුනෙයි උතුර කොටියාශයේ යුද්ධයෙන් පීඩාවට පත් පුද්ගලයින් 8 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් දෙකකට, ජීවනෝපායක් ලෙස අගය එකතු කළ ඉටිපන්දම් නිෂ්පාදනය තිරසර ලෙස සිදු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 0.85කි. අම්පාර දිස්ත්‍රික්කයේ නවිතන්වේලි කොටියාශයේ ප්‍රතිලාභීන් 15 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් 3ක් සඳහා ද ඉහත පරිදිම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. එම ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 0.32කි.








ඈ. සාම්ප්‍රදායික ආහාර සැකසුම් මධ්‍යස්ථානය, වේලනෙයි - යාපනය

නාගදීපය වන්දනාමාන කිරීමට පැමිණෙන බැතිමතුන් සහ සංචාරකයින් ඉලක්ක කර ගනිමින්, යාපනය, කුරිකට්ටුවන් හි වේලනෙයි ප්‍රදේශයේ සාම්ප්‍රදායික ආහාර සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලද අතර, මෙම මුලපිරීම තුළින් යුද්ධයෙන් පීඩාවට පත් පවුල් 5ක් සඳහා නව ජීවනෝපායන් නිර්මාණය කරන ලදි. ව්‍යාපෘතියේ පිරිවැය රු. මිලියන 2.4ක් වූ අතර, සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් මූල්‍ය ආධාර සපයන ලදි.



ඉ. වර්ණවත් දැත් - යාපනය

තිරසර ජීවනෝපායන් ස්ථාපිත කිරීම සඳහා තල්කොළ අත්කම් කර්මාන්තයට අවශ්‍ය අමතර පුහුණුව, අමුද්‍රව්‍ය සහ උපකරණ ලබා දෙමින් යාපනය, තෙන්මාරච්චි කොට්ඨාසයේ යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් 37 දෙනෙකුට ආධාර කරන ලදි. මෙම ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 0.46 කි.

හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් සපයන ලද සහයෝගයෙන් පසු ව, ඔවුන්ගේ දළ මාසික ආදායම ආසන්න වශයෙන් 30% කින් පමණ වැඩි වී ඇත.





ඊ. සිහින ගෙත්තම් - මඩකලපුව

මඩකලපුව, කිරාන් සහ වාලච්චේන යන කොට්ඨාස දෙකෙහි තරුණ කාන්තාවන් 40 දෙනෙකු සඳහා දින 20ක විසිතුරු එම්බ්‍රොයිඩර් පුහුණුවක් සමඟ පුහුණු ද්‍රව්‍ය සහ එම පුහුණු මධ්‍යස්ථාන දෙක සඳහා මහන මැෂින් 3 බැගින් ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 1.74කි. මෙම ආධාරය ලැබීමෙන් පසු, කිරාන් ප්‍රදේශයේ කාන්තාවන් සාප්පුවක් විවෘත කර ආදායම් උපයා ගැනීමට සමත්ව ඇත. වාලච්චේන ප්‍රදේශයේ ප්‍රතිලාභීන් ද රු. 15,000ත් 20,000ත් අතර දළ මාසික ආදායමක් උපයා ගැනීමට සමත්ව තිබේ.





උ. සූර්යය බලශක්ති පැනල ස්ථාපනය සහ නඩත්තු කිරීම පිළිබඳ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන

විදුලි බලය පිළිබඳ මූලික දැනුමක් ඇති මන්නාරම, වවුනියාව, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල යුද්ධයෙන් පීඩාවට පත් තරුණ කණ්ඩායම් සඳහා සූර්යය පැනල සවිකිරීම සහ නඩත්තුකිරීම පිළිබඳ දින දෙකක ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දෙමින් සහයෝගය දක්වන ලදි. එමෙන් ම, පුනර්ජනනීය බලශක්ති සේවා සපයන සමාගම් සමඟ අර්ධකාලීන හෝ පූර්ණකාලීන රැකියා අවස්ථා සඳහා ද පහසුකම් සලසා දෙන ලදි. මෙම වැඩසටහන් 4 හි පිරිවැය රු. මිලියන 1.52 කි.



ප්‍රගතිය

දිස්ත්‍රික්කය	සහභාගි වූ සංඛ්‍යාව	හානිපූරණය සඳහා වන කාර්යාලයෙන් සහාය ලැබීමෙන් පසුව ප්‍රතිලාභ ලබා ගැනීමට සමත් වූ සංඛ්‍යාව	සාර්ථක සහභාගිවූවන්ගේ ප්‍රතිශතය
මන්නාරම	16	11	69%
වවුනියාව	21	15	60%
මඩකලපුව	21	15	71%
ත්‍රිකුණාමලය	52	28	54%

6. සේවා සැපයීමේ ප්‍රතිඵල - මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

2025 වසරේ දී, හානිපූරණය සඳහා වන කාර්යාලය (OR) දිගුකාලීනව පවතින පසුබැසීම් සාර්ථකව අවසන් කරමින් සහ එහි මූල්‍ය ප්‍රතිලාභ ලබාදීමේ පද්ධති විධිමත් කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව අතින් සන්ධිස්ථානගත ජයග්‍රහණයක් අත්කර ගත්තේ ය. ඉහළ නැංවූ ආයතනික සම්බන්ධීකරණය සහ ශක්තිමත් කරන ලද මූල්‍ය කළමනාකරණය තුළින්, මෙම කාර්යාලය 2025 සැප්තැම්බර් මාසය වන විට උතුරු නැගෙනහිර ගැටුමට අදාළ සියලුම හිඟ වන්දි ගෙවීම් අවසන් කළ අතර, ඒ හරහා 1989 වසරේ සිට එකතු වී තිබූ අයදුම්පත් රාශියක් ඵලදායී ලෙස විසඳා ඇත.

මෙම වසර තුළ සේවා සැපයීමේ ප්‍රධාන ජයග්‍රහණවලට පහත දැක්වෙන දෑ ඇතුළත් වේ:

- **ගැටුම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්:** උතුරු නැගෙනහිර ගැටුමෙන් විපතට පත්වූවන් 2,043 දෙනෙකු සඳහා රු. මිලියන 210ක් සහ අතුරුදහන් වූවන්ගේ පවුල් 685ක් සඳහා රු. මිලියන 137ක් බෙදා හැර ඇත.
- **පාස්කු ඉරිදා ප්‍රහාරයේ විින්දිත අරමුදල:** ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට දැඩි ලෙස අනුකූල වෙමින් 2025 ජුනි මාසය වන විට ප්‍රතිලාභීන් සඳහාවන සියලුම ගෙවීම් අවසන් කරන ලදි. ලැබුණු රු. මිලියන 311න් රු. මිලියන 310ක් ප්‍රතිලාභීන් 663 දෙනෙකු වෙත සාර්ථක ව බෙදා හරින ලදි.
- **පරිපූර්ණ සහාය යාන්ත්‍රණයන්:** මූල්‍යමය සහන වලින් ඔබ්බට යමින්, ඒකාබද්ධ යොමුකිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම මඟින් මෙම කාර්යාලය තම මෙහෙයුම් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කළේ ය. මෙම පද්ධතිය මඟින් අම්පාර සහ මන්නාරම වැනි දිස්ත්‍රික්කවල සිටින අවදානමට ලක්විය හැකි පවුල්, "අස්වැසුම" සුභසාධන යෝජනා ක්‍රමය, ආබාධිත දීමනා සහ නිවාස ආධාර ඇතුළු අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන් වෙත සම්බන්ධ කරන ලද අතර, එමඟින් පොදු සම්පත් මත අමතර බරක් පැටවීමකින් තොරව උපරිම බලපෑමක් ඇති කරන ලදි.

7. මූල්‍ය කාර්යසාධනය

I. ආදායම් සහ වියදම් සාරාංශය

හානිපූරණය සඳහා වන කාර්යාලයය
2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන් අංක	2025 රු.	2024 රු. නැවත ප්‍රකාශ කරන ලද
වත්කම්			
ජංගම වත්කම්			
තොගය - ලිපි දව්‍ය	1	1,912,005	1,420,025
සේවක ණය - කෙටි කාලීන	2	2,446,061	1,802,316
ආයෝජන - කෙටි කාලීන	3	55,932,713	67,500,000
සේවක පාරිතෝෂික ආයෝජන	4	32,864,788	30,402,209
අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම්	5	1,732,258	3,187,675
මුදල් සහ මුදල් හා සමාන දෑ	6	16,925,766	94,170,308
		111,813,591	**198,482,533**
ජංගම නොවන වත්කම්			
සේවක ණය - දිගු කාලීන	7	8,298,149	6,628,896
දේපළ, පිරියත හා උපකරණ	8	17,150,432	24,832,817
ආයෝජන - දිගු කාලීන	9	6,000,000	54,932,713
අස්පෘශ්‍ය වත්කම්	10	8,492,058	9,992,521
		39,940,640	**96,386,947**
මුළු වත්කම්		**151,754,230**	**294,869,480**
බැරකම්			
ජංගම බැරකම්			
වෙනත් ගෙවිය යුතු දෑ	11	3,502,427	1,862,535
විශ්‍රාම වරප්‍රසාද වගකීම	12	1,085,350	1,335,982
වෙන් කිරීම් සහ වෙනත් බැරකම්	13	55,932,713	67,500,000
පාස්කු ප්‍රහාරය අප්‍රේල් 2019 විත්දිත අරමුදල	14	581,414	79,241,355
		61,101,904	**149,939,872**
ජංගම නොවන බැරකම්			
වෙන් කිරීම් සහ වෙනත් බැරකම්	15	6,000,000	54,932,713
විශ්‍රාම වරප්‍රසාද වගකීම	16	21,021,974	19,420,001
		27,021,974	**74,352,714**
මුළු බැරකම්		**88,123,878**	**224,292,586**
ශුද්ධ වත්කම්		**63,630,352**	**70,576,894**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
කාල සීමාව සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය		59,559,956	69,851,498
ප්‍රත්‍යාගණන සංචිත		725,396	725,396
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		3,345,000	-
සමුච්චිත අරමුදල		**63,630,352**	**70,576,894**

සහතික කිරීම.

2025 දෙසැම්බර් 31 දිනට ඉහත මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බවත්,
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ශුද්ධ අතිරික්තය/ඌනතාවය අප විසින් සහතික කරමු.

.....
ඩී.ජී.එච්.ඩී. පෙරේරා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)

.....
ජේ. කෘෂ්ණමූර්ති
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී

මෙකී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම හානිපූරණය සඳහා වන කාර්යාලයය සාමාජික මණ්ඩලය සතු වගකීම කි. හානිපූරණය සඳහා වන කාර්යායාලයයේ සාමාජික මණ්ඩලය සහ ඔවුන් වෙනුවෙන් අත්සන් තබා මෙකී මූල්‍ය ප්‍රකාශන අනුමත කරමි.

.....
වසන්තා පෙරේරා
සභාපතිනි

.....
ජේ.ටී.ජී. සුන්දරම්
සාමාජික

හානිපූරණය සඳහා වන කාර්යාලයය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

	සටහන්	2025 රු.	2024 රු.
			නැවත ප්‍රකාශ කරන ලද
ආදායම			
හුවමාරු නොවන ගනුදෙනු තුළින් වන ආදායම			
පුනරාවර්තන ප්‍රදාන	17	433,780,000	2,125,598,995
		433,780,000	**2,125,598,995**
ප්‍රාග්ධන ප්‍රදාන		3,345,000	13,819,625
හුවමාරුවන ගනුදෙනු තුළින් වන ආදායම		**3,501,061**	**4,442,080**
පොළී	18	3,496,861	4,437,773
වෙනත් අයභාර	19	4,200	4,307
මුළු ආදායම		**440,626,061**	**2,143,860,700**
මෙහෙයුම් ප්‍රතිඵලය			
පුනරාවර්තන ආදායම්			
හුවමාරු නොවන ගනුදෙනු තුළින් වන ආදායම		433,780,000	2,125,598,995
හුවමාරු වන ගනුදෙනු තුළින් වන ආදායම		3,501,061	4,442,080
එකතුව		**437,281,061**	**2,130,041,075**

අඩුකලා - පුනරාවර්තන වියදම්

වැටුප්, වේතන සහ සේවක වරප්‍රසාද	20	(61,406,374)	(61,795,506)
ප්‍රතිපත්ති අරමුණු ක්‍රියාත්මක කිරීම	21	(339,372,781)	(2,032,823,612)
වන්දි ගෙවීම සඳහා වූ වෙනත් වියදම්	22	(691,298)	(702,762)
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	23	(2,404,457)	(4,416,915)
ස්ථාවර වත්කම් නඩත්තුව	24	(5,772,555)	(6,529,866)
වෙනත් වියදම්	25	(24,585,929)	(25,846,095)
අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ/(පාඩු)	26		(139,945)
ක්ෂයවීම්	27	(10,851,246)	(10,646,957)
ක්‍රමක්ෂය	28	(1,500,463)	(2,235,604)
ධාරිතාව ගොඩනැගීම	29	(987,500)	
මුළු පුනරාවර්තන වියදම්		**(447,572,602)**	**(2,145,137,262)**
කාල සීමාව සඳහා වත්මන් පුනරාවර්තන අතිරික්තය / ඌනතාවය		**(10,291,541)**	**(15,096,188)**

විස්තීරණ ආදායම් - 2025 වර්ෂය
සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තය

හුවමාරු
නොවන ගනුදෙනු තුළින් ලබන
ආදායම

ප්‍රාග්ධන ප්‍රදාන	3,345,000	13,819,625
හානිකරන අලාභ වලට අදාළ වියදම්		
ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණයෙන් පසු කාලය සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය	**(6,946,541)**	**(1,276,563)**

III. ආර්ථික අගය එකතු කිරීමේ ප්‍රකාශය

හානිපූරණය සඳහා වන කාර්යාලයය - ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2024 හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	කාල සීමාව සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය		ප්‍රතතගණන සංචිත		රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		සමුච්චිත අරමුදල	
	2025	2024	2025	2024	2025	2024	2025	2024
වර්ෂයේ ජනවාරි 01 දිනට ශේෂය	**69,851,497**	**216,994,393**	**725,396**	**725,396**			**70,576,894**	**217,719,789**
වර්ෂය සඳහා වියදම්		(145,866,333)						(145,866,333)
විස්තීරණ ආදායම් - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		13,819,625			3,345,000		3,345,000	13,819,625
කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය /ඌනතාවය	(10,291,541)	(15,096,188)					(10,291,541)	(15,096,188)
වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය	**59,559,956**	**69,851,497**	**725,396**	**725,396**	**3,345,000**	-	**60,630,352**	***70,576,894***

IV. දස අවුරුදු සාරාංශය

පසුගිය වර්ෂ 10 සඳහා මූල්‍ය තත්ත්ව සහ කාර්යය සාධන අවධානයන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2025	2024	2023	2022	2021	2020	2019	2018	2017	2016
	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි	රු. මිලි
මෙහෙයුම් ප්‍රතිඵලය										
ආදායම	433.78	2,125.60	1,405.74	480.53	459.33	397.06	983.19	1,540.70	596.94	518.61
මුළු ආදායම	440.63	2,143.86	1,417.27	487.02	470.38	413.97	1,002.57	1,566.30	631.73	595.91
මුළු වියදම්	447.57	2,145.14	1,431.64	498.15	487.02	397.37	1,001.89	1,553.17	627.34	600.83
කාල සීමාව සඳහා වත්මන් පුනරාවර්තන අතිරික්තය / ඌනතාවය	**(10.29)**	**(15.10)**	**(17.10)**	**(11.48)**	**(17.11)**	**16.59**	**0.68**	**13.13**	**4.38**	**(4.91)**
ප්‍රාග්ධන ප්‍රදාන	3.35	13.82	2.73	0.35	-	-	-	-	-	-
ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ගිණුම්කරණයෙන් පසු කාලය සඳහා සමස්ථ අතිරික්තය / ඌනතාවය	**(6.95)**	**(1.28)**	**(13.64)**	**19.27**	**-**	**-**	**-**	**-**	**-**	**-**
වත්කම්										
ජංගම වත්කම්	111.81	198.48	140.79	307.07	81.18	89.22	126.99	107.60	60.19	49.22
ජංගම නොවන වත්කම්	39.94	96.39	121.18	212.78	522.82	763.50	881.94	894.61	926.97	907.49
මුළු වත්කම්	151.75	294.87	261.96	519.85	604.00	852.71	1,008.93	1,002.21	987.16	956.71
බැරකම්										
ජංගම බැරකම්	61.10	149.94	7.20	2.02	12.54	6.15	7.93	2.92	1.88	1.93
ජංගම නොවන බැරකම්	27.02	74.35	37.04	284.77	377.48	620.12	756.19	755.80	755.04	754.32
මුළු බැරකම්	88.12	224.29	44.24	286.79	390.02	626.26	764.12	758.72	756.92	756.25
ශුද්ධ වත්කම්	63.63	70.58	217.72	233.06	213.98	226.45	244.81	243.49	230.24	200.46
ශුද්ධ වත්කම් / ස්කන්ධය										
ශුද්ධ වත්කම් / ස්කන්ධය හෝ සමුච්චිත අරමුදල	**63.63**	**70.58**	**217.72**	**233.06**	**213.98**	**226.45**	**244.81**	**243.49**	**230.24**	**200.46**

8. මානවසම්පත් සහ ආයතනික ධාරිතාව

I. කාර්ය මණ්ඩල පැතිකඩ

කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය කළමනාකරණ සහ සහායක සේවා මට්ටම් ආවරණය වන පරිදි තනතුරු 74 කින් සමන්විත වේ. 2025 වසර අවසන් වන විට නිලධාරීන් 46 දෙනෙකු සේවයේ යෙදී සිටි අතර, පුරප්පාඩු 28 ක් පිරවීමට ඉතිරිව තිබුණි.

වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මූල්‍ය, පරිපාලන, අභ්‍යන්තර විගණන සහ ක්ෂේත්‍ර මට්ටමේ සේවා සැපයීමේ නියුතු නිලධාරීන්ගේ සහයෝගය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ නායකත්වය යටතේ කාර්යාලය සිය මූලික මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යන ලදි. විශේෂයෙන්ම කළමනාකරණ සහ මෙහෙයුම් ශ්‍රේණි ඇතුළු කාණ්ඩ කිහිපයක පවතින කාර්ය මණ්ඩල හිඟය මධ්‍යයේ වුව ද, විචක්ෂණශීලී සම්පත් කළමනාකරණය සහ කණ්ඩායම් හැඟීම තුළින් කාර්යාලය සිය කාර්යභාරය ඵලදායී ලෙස අඛණ්ඩව ඉටු කිරීමට කටයුතු කළේ ය.

හානිපූරණ නිලධාරීන්, රියදුරන්, කළමනාකරණ සහකාරවරුන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT), අභ්‍යන්තර විගණන සහ පරිවර්තන සේවා වැනි අංශවල කැපී පෙනෙන පුරප්පාඩු පැවති අතර, එය සේවා සැපයීම සහ ආයතනික කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා ඉදිරියේ දී බඳවා ගැනීම් සිදු කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. අත්‍යවශ්‍ය තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය සියලු කටයුතු 2026 වසරේ දී සිදු කිරීමට මේ වන විටත් විධිවිධාන සලසා ඇත.

2025/12/31 දිනට පවතින කාර්ය මණ්ඩල තොරතුරු

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අධ්‍යක්ෂ	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	04	02	2
පරිපාලන නිලධාරී	01	01	-
අභ්‍යන්තර විගණක	01	-	1
තොරතුරු තාක්ෂණ නිලධාරී	01	-	1
හානිපූරණ නිලධාරී	22	12	10
භාෂා පරිවර්තක	01	-	1
අභ්‍යන්තර විගණක සහකාර	01	1	-
කළමනාකරණ සහකාර	26	17	09
රියදුරු	7	4	3
කාර්යාල කාර්ය සහායක	7	6	1
ආරක්ෂක නිලධාරී	1	1	-
එකතුව	**74**	**46**	**28**

II. බඳවා ගැනීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැන්වීම්

බඳවා ගැනීම්

2025 වර්ෂයේ දී පහත සඳහන් බඳවා ගැනීම් සිදු කරන ලදි.

අංකය	සේවකයාගේ නම	සේවක කාණ්ඩය	පත්වීම් දිනය	සටහන්
1	ජේ. ක්‍රිෂ්ණමූර්ති	අධ්‍යක්ෂ ජනරාල්	2025.02.06	වසර 01 ක කාලයක් සඳහා පත් කර ඇත
2	ජේ.පී.එන්.සී. ජයකොඩි	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)	2025.08.21	මාස 04 ක කාලයක් සඳහා පත් කර ඇත (වැඩ බැලීමේ රාජකාරි)
3	කේ.එස්.ඒ. චන්ද්‍රරත්න	රියදුරු (කොන්ත්‍රාත්)	2025.11.05	මාස 06 ක කාලයක් සඳහා පත් කර ඇත

උසස්වීම්

අංකය	සේවකයාගේ නම	සේවක කාණ්ඩය	උසස්වීම් දිනය	උසස් කරන ලද්දේ
1	ආරච්චි, එච්.එන්.	හානිපූරණ නිලධාරී	2025.06.05	III ශ්‍රේණියේ සිට II ශ්‍රේණිය දක්වා
2	නදීකා, එම්. ඒ. ටී.	හානිපූරණ නිලධාරී	2025.07.06	II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා
3	මල්කාන්ති, බී.එච්.	හානිපූරණ නිලධාරී	2025.07.06	II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා
4	අමරසේකර, ඊ.ඒ.ඩී.ඒ.	හානිපූරණ නිලධාරී	2025.11.14	II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා


විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්


අංකය	සේවකයාගේ නම	සේවක කාණ්ඩය	විශ්‍රාම දිනය	ස්වභාවය
1	ජේ.පී. ශාන්ත	නියෝජ්‍ය අධ්‍යක්ෂ	2025.02.08	අභාවප්‍රාප්ත විය
2	එන්.පී. මුසම්මිල්	රියදුරු	2025.03.01	ඉල්ලා අස්විය
3	එස්.එන්.සී.ඩබ්ලිව්.එම්. ධර්මකීර්ති	නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)	2025.07.23	ඉල්ලා අස්විය
4	ජේ. අරවින්දන්	හානිපූරණ නිලධාරී	2025.12.31	ඉල්ලා අස්විය


III. ධාරිතා සංවර්ධනය


ධාරිතා සංවර්ධනය කාණ්ඩය යටතේ වෙන් කරන ලද රු. 1,000,000ක මුළු ප්‍රතිපාදනයෙන්, රු. 987,500 ක මුදලක් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (DLC) හරහා MS Word සහ MS Excel පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වැඩසටහනක් සඳහා අනුග්‍රහය දැක්වීමට උපයෝගී කර ගන්නා ලදි.

IV. කාර්ය මණ්ඩල විවිධත්ව මිනුම්









9. පාලනය සහ අවදානම් කළමනාකරණය

- විගණන කමිටු වාර්තාව

  විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපතිත්වය 2025 ජූලි දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ආචාර්ය අසිස් එම්. මුබාරක් විසින් දරන ලද අතර 2025 නොවැම්බර් සිට රියර් අද්මිරාල් (විශ්‍රාමික) ටෙරන්ස් සුන්දරම් විසින් දරන ලදි. කමිටුව මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ අනුකූලතාව පිළිබඳ අධීක්ෂණයක් ලබා දුන් අතර, කාර්යාලය තුළ ඵලදායී අවදානම් කළමනාකරණය සහ වගවීම සඳහා සහාය විය.

- වංචා වැළැක්වීමේ උපාය මාර්ග

  අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරීම, රාජකාරි වෙන් කිරීම සහ ස්ථාපිත රජයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම මඟින් වංචා වැළැක්වීමේ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට කාර්යාලය කටයුතු කළේ ය. කාර්ය මණ්ඩලය අතර සදාචාරාත්මක හැසිරීම සහ වගවීම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කරන ලද අතර, අක්‍රමිකතා නියමිත වේලාවට හඳුනා ගැනීම සහ වාර්තා කිරීම පහසු කිරීම සඳහා වාර්තාකරණ යාන්ත්‍රණයන් පවත්වාගෙන යන ලදි. ක්‍රමවත් ව සිදු කරනු ලබන සමාලෝචන සහ විගණන ක්‍රියාවලීන් මඟින් විභව වංචා අවදානම් හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා තවදුරටත් සහයෝගය ලැබුණි.

- අභ්‍යන්තර පාලන තක්සේරුව පිළිබඳ වාර්තාව

  මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය, අදාළ රෙගුලාසිවලට අනුකූල වීම සහ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහතික කිරීම සඳහා කාර්යාලය ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. හඳුනාගත් අඩුපාඩු මහහරවා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සොයා බැලීම සඳහා, අනුමත ක්‍රියාකාරී සැලසුම්වලට සාපේක්ෂව කාර්තුමය ප්‍රගති අධීක්ෂණය සිදු කරන ලදි. පාලන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සහ සමස්ත පාලනය හා අවදානම් කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර සමාලෝචන සහ විගණන නිරීක්ෂණ ද සැලකිල්ලට ගන්නා ලදි.

10. ප්‍රධාන අභියෝග සහ උගත් පාඩම්

- **මෙහෙයුම් සහ උපායමාර්ගික අභියෝග**

ඇ. **ධාරිතා සීමාවන්:** සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී ද, කාර්ය මණ්ඩල සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කාර්යාලය දැඩි ධාරිතා සීමාවන්ට දිගින් දිගටම මුහුණ දුන් අතර, එය වැඩසටහන් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට සහ පුළුල් කිරීමට බාධාවක් විය. විශේෂයෙන්ම, මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු කිහිපයක් පුරප්පාඩුව පැවති අතර, බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත් වූ බැවින්, ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් එම වර්ෂය තුළ පත්වීම් ලබා දීමට නොහැකි විය. එපමණක් නොව, කිලිනොච්චිය, වවුනියාව, මඩකලපුව සහ මුලතිව් වැනි ප්‍රධාන දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් නොසිටීම, හානිපූරණ වැඩසටහන් ඵලදායී ලෙස සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අතිරේක අභියෝග මතු කළේය.

ආ. **විශේෂඥ දැනුම නොමැතිකම:** සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, කාර්යාලය සතුව කැප වූ තොරතුරු තාක්ෂණ (IT), නීති සහ මනෝ-සමාජීය වෘත්තිකයන් නොසිටීම දැඩි අභියෝග මතු කළේය. මෙම ධාරිතා හිඳැස් හේතුවෙන්, විස්තීර්ණ හානිපූරණ වැඩසටහන් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කාර්යාලයට ඇති හැකියාව සීමා වූ අතර, එහි මෙහෙයුම්වල කාර්යක්ෂම පරිපාලනයට ද එය බාධාවක් විය.

ඈ. **මූල්‍ය සීමාවන්:** යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන් සඳහා හානිපූරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු සහ නැගෙනහිර පළාත්වලට නිතර ගමන් කිරීමට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු මෙහෙයුම් පිරිවැයක් දැරීමට සිදු විය. මීට අමතර ව, පවතින මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ වත්මන් ආර්ථික පසුබිම නිරූපණයවන පරිදි යාවත්කාලීන කර නොමැති වීම හේතුවෙන්, රජයේ අරමුදල්වලින් අත්තිකාරම් ලබා ගැනීමේ දී පැවති සීමාවන් වැඩසටහන් ආරම්භ කිරීමට බාධාවක් විය. මෙම සාධක, වැඩසටහන්වල ක්‍රියාකාරකම් නියමිත වේලාවට සහ කාර්යක්ෂමව සිදු කිරීමට අභියෝග මතු කළේ ය.

ඉ. **මරණ වන්දි සඳහා විද්‍යාත්මක, ප්‍රමිතිගත සහ වින්දිතයන් කේන්ද්‍ර කරගත් ආකෘතියක්/සූත්‍රයක් නොමැතිකම:** ගැටුම් ආශ්‍රිත සිදුවීම් හේතුවෙන් මියගිය අයගේ ළඟම ඥාතීන්ට වන්දි / මූල්‍ය ආධාර ලබා දීම, හානිපූරණ ක්‍රියාවලියේ ප්‍රධාන අංගයකි. දැනට,

හානිපූර්ණය සඳහා වන කාර්යාලය (OR) එවැනි වන්දි / මූල්‍ය ආධාර පිරිනමනු ලබන්නේ කැබිනට් තීරණ සහ රජයේ චක්‍රලේඛ මත පදනම්ව වන අතර, මෙහි දී බොහෝ විට එක් එක් සිද්ධිය අනුව (case-by-case) වෙනස්කම් සිදු වේ. උදාහරණයක් ලෙස, එකිනෙකට වෙනස් යෝජනා ක්‍රම දෙකක වින්දිතයන් සඳහා වූ මරණ වන්දිය රුපියල් 200,000ක් සහ රුපියල් 500,000ක් වූ අතර, තවත් යෝජනා ක්‍රමයක වින්දිතයන් සඳහා වූ වන්දිය රුපියල් 1,000,000ක් විය. වන්දි ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ආකෘතියක් නොමැති වීම, පීඩාවට පත් ප්‍රජාවන් අතර අසාධාරණය, අසමානතාවය සහ විනිවිදභාවයක් නොමැතිකම පිළිබඳ දැඩි කලකිරීමක් ඇති කිරීමට හේතු වේ.

ඉ. **අධීක්ෂණ සහ බලපෑම් ඇගයීම් සීමාවන්:** හානිපූරණ වැඩසටහන් මඟින් සිදු වූ දිගුකාලීන බලපෑම අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා වූ සීමිත සම්පත් සහ පද්ධතිමය අඩුපාඩු හේතුවෙන්, එම වැඩසටහන්වල ඵලදායීතාවය තක්සේරු කිරීම, වගවීම තහවුරු කිරීම සහ සාක්ෂි මත පදනම් වූ වැඩිදියුණු කිරීම් දැනුම් දීම අභියෝගාත්මක විය.

- **විගණකාධිපතිවරයා (AG) විසින් පෙන්වා දෙන ලද ප්‍රධාන විගණන කරුණු සහ ඒ සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ පියවර:**

  අවශ්‍යතාවට අනුව සියලුම නිවැරදි කිරීමේ පියවර ගෙන ඇති අතර ඒවා විගණකාධිපතිවරයා වෙත වාර්තා කර ඇත.

- **තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා උගත් පාඩම්:**

  වැඩසටහන් වඩාත් සුමටව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා, වඩාත් පුරෝකථනය කළ හැකි සහ යාවත්කාලීන කරන ලද මූල්‍ය රාමුවක ඇති වැදගත්කම හඳුනාගෙන ඇත. අනාගතයේ දී හානිපූරණ වැඩසටහන් සඳහා ප්‍රවේශය, සාධාරණත්වය සහ බලපෑම වැඩිදියුණු කිරීම සඳහා දත්ත පද්ධති ශක්තිමත් කිරීම, අන්තර් ආයතන සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සහ ප්‍රජා සම්බන්ධතා සහ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම ද ප්‍රධාන ප්‍රමුඛතා වේ.

11. ඉදිරි වර්ෂ සඳහා වන සැලැස්ම

- **2025–2030 මූලික උපායමාර්ගික සැලැස්ම** සහ **2026 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම** මත පදනම් වෙමින්, හානිපූරණය සඳහා වන කාර්යාලය (OR), ප්‍රතිස්ථාපන යුක්තිය (restorative justice) සහ විඳිතයන් සවිබල ගැන්වීම සඳහා වූ බහුවිධ ප්‍රවේශයක් වෙත කැපවී සිටී. අපගේ ඉදිරි මූලපිරීම්වල ප්‍රධානතම අංගය වන්නේ, තිරසර ජීවනෝපාය සංවර්ධනය සහ මනෝ-සමාජීය සහයෝගය කෙරෙහි මූලික අවධානයක් යොමු කරමින් හානිපූර්ණ කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 400ක ශක්තිමත් පුනරාවර්තන අයවැයකි. හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුණ වන්නේ ජීවනෝපාය මූලපිරීම් මඟින් පීඩාවට පත් පුද්ගලයන් රජය මත යැපීමේ තත්ත්වයෙන් මුදාහැර, ඔවුන්ව ආර්ථික ස්වාධීනත්වය කරා යොමු කිරීමයි. උතුරු සහ නැඟෙනහිර පළාත්වල සෘජු ප්‍රතිලාභීන් 250කට වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසෙන පරිදි 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ජීවනෝපාය සහාය මූලපිරීම් දහයක් (10) පහත පරිදි සැලසුම් කර ඇත.

    1. ඕෂන් ලීෆ් – මන්නාරම තිරසර මුහුදු පැලෑටි (ඇල්ගී) වගාව - විඳිතයින් සඳහා ජීවනෝපාය මූලපිරීම - නානාට්ටන්, මන්නාරම
    2. සිහින ගෙත්තම් – අරි එම්බ්‍රොයිඩර් පුහුණු වැඩසටහන – නානාට්ටන්, මන්නාරම
    3. සිහින ගෙත්තම් –
    4. අරි එම්බ්‍රොයිඩර් පුහුණු වැඩසටහන – මූලතිව්
    5. වර්ණවත් දැත් – තල් අත්කම් නිෂ්පාදන මූලපිරීම - චන්කනායි, යාපනය
    6. වර්ණවත් දැත් – තල් අත්කම් නිෂ්පාදන මූලපිරීම - චන්කනායි, යාපනය - නගර සහ කඩවත්, ත්‍රිකුණාමලය
    7. අගය එකතු කළ සබන් නිෂ්පාදනය - මොරවැව, ත්‍රිකුණාමලය
    8. සූර්ය බලශක්ති උපයෝගිතා සහ විදුලි පද්ධති සවි කිරීම් – නල්ලූර්, යාපනය
    9. සූර්ය බලශක්ති උපයෝගිතා සහ විදුලි පද්ධති සවි කිරීම් – කරච්චි, කිලිනොච්චි
    10. සූර්ය බලශක්ති උපයෝගිතා සහ විදුලි පද්ධති සවි කිරීම් – අම්පාර
    11. සූර්ය බලශක්ති උපයෝගිතා සහ විදුලි පද්ධති සවි කිරීම් – මුහුදුබඩපත්තු, මූලතිව්

- පීඩාවට පත් පුද්ගලයන්ගේ මනෝසමාජීය යහපැවැත්ම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2026 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 5ක් වෙන් කර ඇත. මෙම මූලපිරීම් පහත සඳහන් ක්‍රියාමාර්ග හරහා ප්‍රතිස්ථාපන සේවා (restorative

care) සැපයීම කෙරෙහි අවධානය යොමු කරයි: **සිද්ධි කළමනාකරණය (Case Management):** යාපනය, ත්‍රිකුණාමලය සහ ගාල්ල ඇතුළු දිස්ත්‍රික්ක නවයක් පුරා පැතිරුණු පවුල් 40ක් සඳහා සිද්ධි කළමනාකරුවන්ගේ මැදිහත්වීම මත සෘජු මනෝසමාජීය සහාය (PSS) සේවා සැපයීම. **දැනුවත් කිරීම සහ ආරක්ෂාව:** වැලිඔය සහ කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මවුපිය රැකවරණය, ළමා ආරක්ෂණය මෙන්ම නව යොවුන් වියේ ගැබ්ගැනීම් සහ ළමා විවාහ වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. **ධාරිතා සංවර්ධනය:** හානිපූර්ණ සේවාවන් වඩාත් කම්පන ප්‍රතිචාරාත්මක (trauma-informed) සහ චින්දිතයන් කේන්ද්‍ර කරගත් ආකාරයෙන් ලබා දීම සහතික කිරීම සඳහා, මනෝ සමාජීය ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර කාර්ය මණ්ඩල ධාරිතාවයේ පවතින හිඳැස් පියවීම. සමාජීය ක්‍රියාකාරීත්වය සහ ගැටලුවලට මුහුණ දීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම මඟින්, සංහිඳියාව සඳහා අත්‍යවශ්‍ය වන දිගුකාලීන ස්වතන්ත්‍රතාව සහ සුවපත් වීම ළඟා කර දීමට කාර්යාලය අරමුණු කරයි.

- මීට අමතරව, කාර්යාලය විසින් **මූල්‍ය සහන** සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. ඒ යටතේ, අතුරුදහන් වූවන්ගේ පවුල් 1,500ක් සඳහා පුනර්ජීවන දීමනා ලෙස **රු. මිලියන 300ක්** ද, ගැටුම් හේතුවෙන් සිදු වූ දේපළ හානි සහ මරණවලට ලක්වූ චින්දිතයන් වෙනුවෙන් රු. මිලියන 90ක් ද වෙන් කරනු ලැබේ.
- මෙම වැඩසටහන්වල දිගුකාලීන ඵලදායීතාවය තහවුරු කිරීම සඳහා, හානිපූරණය සඳහා වන කාර්යාලය තීරණාත්මක පද්ධතිමය වැඩිදියුණු කිරීම් කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

    - **හානිපූරණ කටයුතු ප්‍රමිතිකරණය:** ගැටුම් ආශ්‍රිත මරණ වන්දි සඳහා විද්‍යාත්මක, චින්දිතයන් කේන්ද්‍ර කරගත් ආකෘතියක් සහ අතුරුදහන් වූවන්ගේ පවුල් සඳහා සියල්ල ඇතුළත් ආකෘතියක් සංවර්ධනය කිරීම.
    - **ආයතනික ධාරිතා සංවර්ධනය:** අපට පැවරී ඇති වගකීම් වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා, දැනට පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු (තනතුරු 29ක්) පිරවීම සහ නීති, මනෝසමාජීය සහ තොරතුරු තාක්ෂණ (IT) ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම ඉහළ නැංවීම.
    - **යොමු කිරීම සහ ඒකාබද්ධ කිරීම:** අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව විස්තීර්ණ සහයෝගයක් සහතික කිරීම සඳහා ඉඩම් හිමිකම්, නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් සම්බන්ධ යොමු කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම.
    - **මෙහෙයුම් යටිතල පහසුකම්:** ඵලදායී සේවා සැපයීම සඳහා අවශ්‍ය වන පුළුල් ක්ෂේත්‍ර මැදිහත්වීම් සඳහා සහය වීම පිණිස කාර්යාලීය පහසුකම් සහ වාහන ඇණිය වැඩිදියුණු කිරීම.

12. ඇමුණුම් - විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පේඑල්ඕ/සී/සී/ආර්ඊපී/එෆ්ජී/2025 } ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 මැයි 29 දින

සභාපති
හානිපූරණය සඳහා වන කාර්යාලය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01හි 07 වන ඡේදය ප්‍රකාරව සේවක මණ්ඩල රක්ෂණාවරණය වෙනුවෙන් දරන ව්‍යදම උපචිත පදනම මත හඳුනානොගැනීම නිසා වර්ෂය තුළ හඳුනාගත් රක්ෂණ ව්‍යදම රු.269,394ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2025 වර්ෂයේදී හා 2026 වර්ෂය වෙනුවෙන් දරන ලද රු.1,831,283ක ව්‍යදම් කලින් ගෙවූ ව්‍යදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2025 ජනවාරි 01 දිනට ඒකාබද්ධ ණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුවේ ආයෝජනය කර තිබූ රු.52,000,000ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු.23,000,000ක මුදලක් කල්පිරී තිබූ අතර, එය රු.19,000,000 ලෙස හඳුනා ගැනීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් තුළ කෙටිකාලීන ආයෝජන රු.4,000,000ක් වැඩියෙන් ද ජංගම බැරකම් තුළ වෙන්කිරීම් හා වෙනත් බැරකම් රු.4,000,000ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) පරිගණක දත්ත පද්ධතියේ 2014 වර්ෂයේ මිලදීගත් රු.2,688,000ක් වටිනා වත්කමේ ක්ෂය ලියාහැරීම අවසන්ව තිබුණ ද, 2025 වර්ෂයේ දී රු.268,800ක් ක්ෂය ලියාහැරීමක් ලෙස හඳුනාගැනීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලීබඩු හා උපකරණ තුළ අන්තර්ගත රු.3,107,760ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්ව තිබුණ ද, 2025 වර්ෂයේ දී රු.295,731ක් ක්ෂය ලෙස හඳුනාගැනීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ ක්ෂය වියදම වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කාර්යාලයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කාර්යාලයේ, 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවා ද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව කාර්යාලයේ, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි කාර්යාලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබාගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවකිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අදාළ වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක්නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) ඡේදය	අභ්‍යන්තර විගණකවරයෙකු මේ දක්වා පත්කර නොතිබුණි.
(ආ)	2008 පෙබරවාරි 06 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 හා 05/2008(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම මේ දක්වාම ඉටුකර නොතිබුණි.

(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය	
	(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදයේ උපලේඛන 1 හි 3 ඡේදය	ප්‍රධාන අයවැය ලේඛනය තුළ ඇතුළත් විය යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය තුළ ඇතුළත්කර නොතිබුණි.
	(ii) මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුව ද, 2024 වර්ෂයේ වාර්තාව 2025 දෙසැම්බර් සභාගත කර තිබුණි.
(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ඡේදය	අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඉ)	2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 14.6 ඡේදය.	වර්ෂය අවසානයේ ඉතිරි ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතු වුවද ඉන් බැහැරව රු.16,287,015ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතුකර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර නොමැති බව.

(අ) කාර්යාල පරිශ්‍ර වෙන්කිරීම (පාටිෂන්) සඳහා රු.100,000ක මුදලක් ද ගිණුම්කරණ පැකේජයක් මිලදීගැනීම වෙනුවෙන් රු.1,000,000ක මුදලක් ද වෙන්කර තිබුණද, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් උපයෝජනයකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුව ලීබඩු, කාර්යාල උපකරණ සහ පරිගණක උපාංග මිලදීගැනීම සඳහා පිළිවෙලින් රු.150,000ක් සහ රු.1,510,000ක් වෙන්කර තිබූ අතර, සත්‍ය වියදම පිළිවෙලින් රු.338,855ක් සහ රු.2,063,490ක් විය. ඒඅනුව සැලසුම්ගත ප්‍රතිපාදන ඉක්මවා සියයට 126ක් සහ සියයට 37ක් වැයකර තිබුණි. අයවැය පාලනය, පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඇ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා වන භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන අත්පොතෙහි 5.4(ඇ) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවිය යුතු වුවත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඇ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා වන භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන අත්පොතෙහි 7.10(ආ) ඡේදය ප්‍රකාරව ලැබී ඇති සියලු

ලංසු ප්‍රතික්ෂේප වන අවස්ථාවල දී සියලුම ලංසුකරුවන් වෙත ප්‍රතික්ෂේප කිරීමේ තීරණය හේතු සහිතව දැනුම් දිය යුතු වුව ද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඉ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා වන භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන අත්පොතෙහි 8.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව, ලංසු ඇගයීම් කමිටු වාර්තාවේ දැක්වෙන නිර්දේශ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ප්‍රතික්ෂේප කරන්නේ නම් එකී ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ හේතු දැක්විය යුතු වුවත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තුවට අනුව වන්දි ගෙවීම වෙනුවෙන් රු.2,243,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, ඉන් සියයට 84ක් ඉතිරිව පැවතුණි. විස්තර පහත පරිදි වේ.

(i) අතුරුදහන් වූවන්ගේ කාර්යාලයෙන් නිර්දේශ කරන ගොනු 5,000ක් වෙනුවෙන් රු. මිලියන 1,000ක් සඳහා අයවැය සකස්කර ඉදිරිපත්කර තිබූ අතර, එම අයවැය සකස්කිරීමේ දී අතුරුදහන් වූවන්ගේ කාර්යාලයෙන් ලද ක්‍රියාකාරී සැලැස්ම පදනම්කර ගෙන තිබුණි. අතුරුදහන් වූවන්ගේ කාර්යාලයෙන් ලද ගොනු 697කින් සමාලෝචිත වර්ෂය තුළ ගොනු 684ක් සඳහා පමණක් රු.136,800,000ක් ගෙවීම්කර තිබුණි.

(ii) හානිපූරණ සඳහා වන කාර්යාලය මගින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වැඩසටහන් 05ක් සඳහා රු. මිලියන 30ක් අයවැය මගින් වෙන්කර තිබුණ ද, ඉන් සියයට 99.9ක ප්‍රතිපාදන උපයෝජනය වී නොතිබුණු අතර, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2025 ජනවාරි, මාර්තු හා ජුනිවල පිළිවෙලින් රු.මිලියන 01ක බැගින් රු.මිලියන 03ක් භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණ ද, එයින් රු.26,905ක් පමණක් හානිපූරණය සඳහා වන කාර්යාලය මගින් උපයෝජනය කර තිබුණි.

(උ) වෙනත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.මිලියන 45ක ප්‍රතිපාදන වෙන්කර, ඉන් රු.මිලියන 18.78ක් පුනරාවර්තන වියදම් සඳහා ඉල්ලුම්කර තිබූ අතර, සත්‍ය වියදම රු.මිලියන 35.168කි. ඒ අනුව ප්‍රතිපාදනවලින් රු.මිලියන 9.83ක් එනම් සියයට 22ක් ඌණ උපයෝජිතව තිබුණි.

(ඌ) සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) මගින් ප්‍රජාපාදක ක්ෂුද්‍ර ව්‍යාපෘති ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.1,675,127ක් ප්‍රදානයකර තිබුණ ද, 2024 වර්ෂයේ ජීවනෝපාය සහ මනෝසමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මගින් මූල්‍යාධාර ලබා දීමට එකඟවීම මත හානිපූරණ සඳහා වන කාර්යාලය මගින් දරා තිබූ වියදම පිළිබඳ නිසිලෙස වාර්තා නොවීම හේතුවෙන් එසේ ලද මුදල් ඌණ උපයෝජිත ලෙස භාණ්ඩාගාරයේ ගිණුම්වල නිරීක්ෂණය විය.

3. වෙනත් කරුණු

(අ) භාණ්ඩාගාර වියදම් සාරාංශය අනුව වන්දි ගෙවීමේ කටයුතු හා අනෙකුත් හානිපූරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත්කළ අක්මුදල් ප්‍රමාණය රු.355,000,000ක් වූව ද, තථ්‍ය වියදම රු.339,372,781ක් වූ අතර, ඒ අනුව භාණ්ඩාගාර වියදම් සාරාංශයේ රු.15,627,219ක් වැඩියෙන් නිරූපණය වන අතර, තථ්‍ය වියදම නිවැරදිව නිරූපණය නොවී ය. තව ද, අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා රු.45,000,000ක් වෙන්කර තිබුණ ද, ඉන් අක්මුදල් ලෙස රු.18,780,000ක් පමණ ලබාගෙන තිබුණ ද, තථ්‍ය වියදම රු.35,168,536කි. ඒ අනුව වැඩිපුර

දරන ලද වියදම වූ රු.16,388,536ක් වූ මුදල වන්දි ගෙවීමට හා හානිපූරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ලද අතිරික්ත මුදල වූ රු.15,627,219න් හා ආයතනයේ ආරම්භක මුදල් ශේෂයන් ලබාගෙන වැයකර තිබුණි. ඒ අනුව වන්දි හා අනෙකුත් හානිපූරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලබාගත් අක්මුදල් වෙනත් පුනරාවර්තන වියදම් සඳහා යොදවාගැනීමෙන් තථ්‍ය වියදම භාණ්ඩාගාර වියදම් සාරාංශය තුල නිරීක්ෂණය නොවී ය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත ආයතනික දීමනා ලෙස රු.786,708ක් ගෙවා තිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
இழப்பீடுகளுக்கான அலுவலகம் - இலங்கை
Office for Reparations - Sri Lanka

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
Ministry of Justice and National Integration

මගේ අංකය. / எனது இல. / My No.: හානිපූරණ/අ.වි/විගණන විමසුම්/2026

ඔබේ අංකය. / உமது இல. / Your No.:

දිනය. / திகதி. / Date: 15 .07.2026

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය,

අංක. 306, පොල්දූව පාර,

බත්තරමුල්ල.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ **2025** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඉහත ඔබගේ අංක JLO/C/C/REP/FA/2025 හා 2026 මැයි 29 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇති විගණන විමසීම් වලට අදාල පිළිතුරු මේ සමග ඔබගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

ජේ.තට්ටිඡ්ජූන්

අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

අංක.40, බුත්ගමුව පාර, රාජගිරිය
இல.40, புத்கமுவ வீதி, ராஜகிரிய.
No.40, Buthgamuwa Road, Rajagiriya

කාර්යාලය அலுவலகம் Office: 011 - 2883939
ෆැක්ස් பெக்ஸ் Fax: 011- 2886797
ඊ මේල් இ - மெயில் E- mail: info@reparations.gov.lk
වෙබ් අඩවිය இணையம் Web Site: www.reparations.gov.lk

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2025 වර්ෂයේ දී ආයතනය විසින් සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණාවරණය වෙනුවෙන් රු.3,079,592.08 ක මුදලක් වැය කර ඇති අතර 2025 වර්ෂයේ අවසාන මාස 03 වන ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා සේවකයින්ගෙන් අය කළ යුතු රක්ෂණ වාරික මුදල වන රු.159,470.07 ක මුදල වැටුපෙන් මාසික ව අය කර ඇති අතර 2026 වර්ෂයේ මුල් මාස 09 සඳහා සේවකයින්ගෙන් අය විය යුතු වාරික මුදල වන රු.478,592,08 ක මුදල අය කර ගැනීම සඳහා ජර්නල් වවුචර 10 මඟින් වෛද්‍ය රක්ෂණාවරණය ගිණුමට බැර කොට ලැබිය යුතු ලැබීම් ගිණුමට මාරු කර ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයට අදාළ සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණාවරණය වියදම වශයෙන් රු.2,441,711.80 ක මුදල වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර ඇත.

එසේ ම සේවක මණ්ඩල වෛද්‍ය රක්ෂණාවරණය යටතේ දරණු ලබන ගාස්තුවෙන් 25% ක අගයක් (බදු, පරිපාලන වියදම් හා අනෙකුත් වියදම් රහිතව) සේවක මණ්ඩලයෙන් අය කරන ආකාරයෙන් මෙකී රක්ෂණාවරණය ක්‍රියාත්මක වන බව වැඩි දුරටත් දන්වනු කැමැත්තෙමි.

කෙසේවුවත්, විගණන නිරීක්ෂණය තවදුරටත් අධ්‍යනය කිරීමේදී විමසුමේ සඳහන් කරුණු නිවැරදි බවට හඳුනාගත හැකි බැවින් 2025 වර්ෂයේ ශුද්ධ අතිරික්තයට ගැළපීම් කර අවසාන ගිණුම් යථාවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

(ආ) ඔබගේ නිරීක්ෂණයේ සඳහන් වන රු.4,000,000.00 ක ආයෝජිත මුදල කල් පිරීමෙන් පසුව ලංකා බැංකුව විසින් ලබාදෙනු ලබන චෙක්පත අප ආයතනය වෙත ලැබී ඇත්තේ 2026 ජනවාරි 05 වන දින බැවින් 2025 දෙසැම්බර් 31 වන දිනට පෙර මෙකී මුදල් ප්‍රමාණය මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට හැකියාවක් නොවූ බැවින් නිරීක්ෂණයේ සඳහන් ආකාරයට ගිණුමට ගැළපුම් කර තිබුණි.

(ඇ) විගණන නිරීක්ෂණ හා එකඟ වේ . 2026 වර්ෂයේ ගිණුමින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඈ) විගණන නිරීක්ෂණ හා එකඟ වේ . 2026 වර්ෂයේ ගිණුමින් නිවැරදි කිරීමට කටයුතු කරමි.

02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර් යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

(අ) **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) ජේදය**

2026.04.17 දිනැති ගැසට් පත්‍රය මඟින් අයඳුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකින් පසු, 2026.06.10 දිනැතිව ආයතනය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කරන ලදි.

(ආ) **2008 පෙබරවාරි 06 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 හා 05/2008(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

විගණන නිරීක්ෂණය හා එකඟ වේ. නිරීක්ෂණය පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඇ) **2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛ**

i. **මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ජේදයේ උපලේඛන 1 හි 3 ජේදය**
විගණන නිරීක්ෂණය හා එකඟ වේ. නිරීක්ෂණය පරිදි ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

ii. **මෙහෙයුම් අත්පොතෙහි 6.6 ජේදය**
විගණන නිරීක්ෂණය හා එකඟ වේ. වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමේ ප්‍රායෝගික ගැටළුවක් පවතින නමුත්, 2025 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(ඈ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ජේදය**

විගණන නිරීක්ෂණය හා එකඟ වේ. නිරීක්ෂණය පරිදි වසර තුනක කාලයක් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම කෙටුම්පත් කර අවසන් කර ඇති අතර ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම්කොට ඇත.

(ඉ) **2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 14.6 ජේදය**

2025 අයවැය ප්‍රතිපාදන මත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරය විසින් වැය විෂයන් ද්විත්වයක් යටතේ අප ආයතනය වෙත මාසික ව ලබාදෙන ලද අක්මුදලට එරෙහි ව දරණ ලද වියදම් ප්‍රමාණය ගැලපීමෙන් අනතුරු ව 2025 දෙසැම්බර් 31 දිනට තව දුරටත් ඉතිරි වූ ශේෂය ලෙස හඳුනා ගනු ලැබූ රු.638,751.00 ක මුදල 2026 ජනවාරි මාසයේ දී මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස, සහ එහි ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර නොමැති බව.

(අ) විගණන නිරීක්ෂණයේ සඳහන් කර ඇති කාර්යාල පරිශ්‍ර වෙන් කිරීම සඳහා මූලික පියවර ගෙන තිබුණද, පසුකාලීනව කාර්යාල පරිශ්‍ර වෙන් කිරීමේ අවශ්‍යතාවයක් නොවන බවට හඳුනා ගැනීම මත එම කටයුතු සිදු නොකරන ලදි.

එමෙන්ම, ගිණුම් අංශය විසින් යෝජනා කර තිබූ ගිණුම්කරණ පැකේජය සඳහා අවශ්‍ය පිරිවිතරයන් සකස් කිරීමට ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවය මතු විය. ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිහිපවරක් සාකච්ඡා කිරීමෙන් අනතුරුව වෙන්කරන ලද ප්‍රතිපාදන ගිණුම්කරණ පැකේජයක් මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බවත්, ඒ සඳහා අති විශාල මුදලක් වැය කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන බැවින් අත්‍යාවශ්‍ය නොවන වියදමක් වන බවට හඳුනා ගැනීම මත මෙම වෙන්කළ මුදල උපයෝජනය නොකරන ලදි.

(ආ) ලී බඩු හා කාර්යාල උපකරණ යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කළ අයිතම ප්‍රමාණයට වඩා වැඩි අයිතම ප්‍රමාණයක්, ප්‍රායෝගිකව මෙන්ම සේවයේ අවශ්‍යතාවය මත මිලදී ගැනීමට සිදු වීම හේතු කොටගෙන සැලසුම්ගත මුදලට වඩා ඉහළ මුදලක් ඒ සඳහා වැය වී ඇත. එමෙන්ම, පරිගණක උපාංග යටතේ මිලදී ගැනීමට සැලසුම්කර තිබූ ලැප්ටොප් පරිගණකවල වෙළඳපොළ මිල ඇස්තමේන්තු කළ මිලට වඩා ඉහළ මිලක් ගැනීම මත ඒ සඳහා ද සැලසුම්කරණයේදී බලාපොරොත්තු වූ වටිනාකමට වඩා ඉහළ වටිනාකමක් ගෙවීමට සිදුවීම මත ප්‍රතිපාදන ඉක්මවායෑමක් සිදු වී ඇත.

ඉදිරියේදී, ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමේදී කාලීන වෙළඳපොළ මිල ගණන් හා ආයතනික අවශ්‍යතාවයන් පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කරනු ඇත.

(ඇ) විගණන නිරීක්ෂණය පරිදි ඉදිරියේදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඈ) විගණන නිරීක්ෂණය පරිදි ඉදිරියේදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඉ) විගණන නිරීක්ෂණය පරිදි ඉදිරියේදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි.

(ඊ) (i) විගණන නිරීක්ෂණය හා එකඟ වේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පාදක කර ගනිමින් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2025 වර්ෂය සඳහා එම විෂයයට අදාළව ලිපිගොනු 5,000 ක් සඳහා රු.මිලියන 1,000 ක මුදලක් අයවැයගත කරන ලදි. නමුත් එම කාර්යාලය මඟින් අදාළ ගොනු ප්‍රමාණය ලබාදීමට සමත් නොවීම මත අප ආයතනයට අයවැයගත ගෙවීම් ප්‍රමාණය සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොවීය.

එමෙන්ම, 2025.12.31 දින වන විට හානිපූරණය සඳහා වන කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයෙන් ලද නිර්දේශ ලිපිගොනු 697 ක් අතරින් ලිපිගොනු 684 ක් සඳහා ගෙවීම් අවසන් කර ඇත. එය සමස්ථ වශයෙන් 98% ක ඵලදායීතාවයක් වන අතර ඉතිරි ගොනු 13 ඉතිරිව ඇත්තේ ආදායකයන් විසින් ඔවුන්ගේ බැංකු ගිණුම් විස්තර නිවැරදිව ආයතනය වෙත ඉදිරිපත් නොකිරීම මෙන්ම බැංකු ගිණුම් විස්තර අප ආයතනය වෙත ලබාදීමේ ප්‍රමාදයන් හේතු කොටගෙනය.

(ii) විගණන නිරීක්ෂණය හා එකඟ වේ.

ඉදිරියේදී වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් ව්‍යාපෘතීන් නියමිත කාලයන්හීදී නිමකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි.

(උ) විගණන නිරීක්ෂණය හා එකඟ වේ.

පුනරාවර්තන වියදම් සම්බන්ධව අරපිරිමැස්මෙන් කටයුතු කිරීමත් අත්‍යවශ්‍ය වියදම් සඳහා පමණක් වැය කිරීමත් මත අදාළ ප්‍රතිපාදනයෙන් 22% ක් ඉතිරිවූ බව දන්වා සිටිමි.

(ඌ) හානිපූරණය සඳහා වන කාර්යාලයට 2025 වර්ෂයෙහි සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් රු. 1,675,127ක මුදලක් ප්‍රදානය කරන ලද්දේ 2024 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රජාපාදක ක්ෂුද්‍ර ව්‍යාපෘති සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් වැය කරන ලද මුදල් සඳහා ය. 2024 වර්ෂයේ ජීවනෝපාය සහ මනෝසාමාජීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් මූල්‍යාධාර ලබා දීමට එකඟ විය. මෙම රු. 1,675,127ක මුදල සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් 2024 වර්ෂයෙහි හානිපූරණය සඳහා වන කාර්යාලයට ලබා දීමට ප්‍රමාද විය. එම හේතුවෙන් කලින් සැලසුම් කරන ලද එම වැඩසටහන් හානිපූරණය සඳහා වන කාර්යාලයේ ප්‍රතිපාදන මත නිම කරන ලදී. එබැවින් ඉහත රු. 1,675,127ක මුදල හානිපූරණය සඳහා වන කාර්යාලයට අයවිය යුතු මුදලකි.

3 වෙනත් කරුණු

(අ) විගණන නිරීක්ෂණය හා එකඟ වේ.

මෙම ආයතනයේ වියදම් සඳහා අක් මුදල් ලබා දීම මහා භාණ්ඩාගාරයෙන් සිදු කරන අතර වන්දි ගෙවීමේ කටයුතු හා අනෙකුත් හානිපූරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලද අක් මුදල් ප්‍රමාණයක් අතිරික්ත වන බව හඳුනා ගැනීමෙන් පසුව හා වෙනත් පුනරාවර්තන වියදම් සඳහා ලබා දුන් අක් මුදල් වටිනාකම ප්‍රමාණවත් නොවන බව (ඌණ වන බව) හඳුනා ගැනීමෙන් අනතුරු ව අන්තර් හුවමාරුවක් ලෙස සලකා මෙලෙස කටයුතු කර ඇත. ඉදිරියේ දී අතිරික්ත අක් මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමටත් වැය විෂයට අදාළ ව ලබා දෙන අක් මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී අවශ්‍ය අගය ඉල්ලුම් කර ලබා ගෙන වියදම් දැරීමටත් කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් ට උපදෙස් ලබා දෙන ලදි.

(ආ) ඔබගේ නිරීක්ෂණයන් ට පදනම් ව ඇති ආයතනික දීමනාව 1994 වර්ෂයේ සිට 2025 ජනවාරි දක්වා මාසික ව මෙසේ ගෙවීම් කර ඇත.

1994 සිට 2009	රු. 600.00
2009 සිට 2015	රු. 1,000.00
2016 සිට 2022 අගෝස්තු	රු. 1,500.00
2022 සැප්තැම්බර් සිට 2024	රු. 2,500.00
2025 සිට 2026 අප්‍රේල් දක්වා	රු. 4,000.00

ඉහත සඳහන් ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබා දී අතර එකී අනුමැතීන් ලබාදීමේ දී ආයතනයට අනන්‍ය වූ රාජකාරී ස්වභාවය, ආයතනික කාර්යය භාරය, කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු ප්‍රමාණය හා මූල්‍ය අගයන් හි කාලීන වෙනස්වීම් ද සැලකිල්ලට ගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි.

කෙසේ වූව ද ඔබගේ නිරීක්ෂණ පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙකී ආයතනික දීමනාව වෙනුවෙන් ලබා ගැනීම සඳහා 2026.06.10 දිනැතිව අමාත්‍යාංශ ලේකම් හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකොට කොට ඇත.